## 2021/11/09 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2021/11/09 දින පෙ.ව. 9.30 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| 1. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

### 01. ආගම සිහි කිරීම

2021.11.09 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, සියලු දෙනාගෙන් අවසරයි. කොරෝනා වසංගත තත්ත්වය හමුවේ මීට ප්‍රථම සභා වාර පැවැත්වූයේ සෞඛ්‍ය නීති රීති වලට අනුකූලව, දුරස්ථ භාවය රැකගනිමින්. නමුත් නැවත අද දින පෙර පරිදි සභාව පැවැත්වීමට යොමු වූයේ මේ වන විට ක්‍රම ක්‍රමයෙන් රට යථා තත්වයට පත්වෙමන් තිබෙන නිසා බව පළමුවෙන්ම ප්‍රකාශ කරන මුත්, සිතේ තබා ගත යුතු දෙයක් තමයි. මෙම ව්‍යසනය සම්පූර්ණයෙන්ම පහව ගොස් නැති බව. ඒ අනුව අද දින දැණුම් දීම පරිදි ගරු සභාවට සහභාගි වන ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා පිළිගනිමින්, සභාව ආරම්භ කරනවා. තවද අද දින කාලගුනය අයහපත් වීම නිසා අධිකව වර්ෂාව පවති බැවින්, ප්‍රදේශ කිහිපයක් ජලයෙන් යට වී ඇති බැවින් මෙම ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීවරු කිහිප පලකගේ පැමිණීම ප්‍රමාද වන බවද දැණුම් දුන් බවද, ප්‍රකාශ කරනවා.

**(අ)01. 2021.10.12 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

01. පසුගිය සභා වාරයේදී ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව පැවෙත්වෙන අතරතුර, ඊට විරෝධය දක්වමින්, එක්සත් ජාතික පක්ෂයේ වසන්ත කුමාරගේ මහතා හැර අන් සියළු මන්ත්‍රීවරුන් සභා ගර්භයෙන් පිටවීම සම්බන්ධව සභා වාර්තාවේ සඳහන් නොවූ බව ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා සහ ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා පෙන්වා දෙන ලදී.

**2021.10.12 දින පැවති මහා සභාවේ සභා වාර්තාව ඉහත සංශෝධනයට යටත්ව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රි ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. කේ.යූ.ජේ.කේ. මේනු ශෂිකලා මිය, පෙර පාසල් පාලිකා, හඟරන්වල දිමුතු පෙර පාසල විසින් 2021.11.04 දිනැතිව යොමු කරන ලද අස්වීමේ ලිපිය සභාගත කරන ලදී.

02. ප්‍රදේශවාසීන්, දිඹුලෝවිටවත්ත, ගා/නාගොඩ විසින් 2021.11.08 දිනැතිව යොමු කරන ලද දිඹුලෝවිට වත්ත පාර ගොඩ කර ගැනීම සඳහා පස් ලබා ගැනීම යන ඉල්ලීමේ ලිපිය සභාගත කරන ලදී.

03. උඩුගම පිහිටි නෙළුවේ ශ්‍රී ගුණානන්ද මාවත සංවර්ධනය කර දෙන ලෙසට ඉල්ලීම යන මැයෙන් උඩුගම නැගෙනහිර ගුණානන්ද මාවතේ ප්‍රදේශවාසීන් විසින් යොමු කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

01. මාපලගම නගරයේ ළමා උද්‍යානයේ සෙල්ලම් උපකරණ සවිකිරීමට ගිය රු. 620550 ක මුදල දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන ලැබුණු පසු ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත සභා අරමුදලින් ගෙවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. ප්‍රාදේශීය සභාව සතු ඇප්තොප්වත්ත ඉඩමේ අක්කර 02 ක භූමියේ කුරුඳු වගා කිරීම සඳහා වැවිලි කර්මාන්ත ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගෙන් කල ඉල්ලීම අනුමත වී ඇති බැවින්, එහි බිම සකස් කිරීම, පැල සිටුවීම සහ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලැබෙන බට් අඹ පැළ 60 රෝපණය කිරීම සඳහා වැය වන මුදල සභා අරමුදලින් ගෙවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. ඉදිවෙමින් පවතින ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය සකස් කිරීමේදී බාධකයක්ව පවතින කලු ගල බෝර ගසා ඉවත් කිරීම සඳහා රු. 150,000.00 ක මුදලක් ඇස්තමේන්තු කර ඇති අතර, ඒ සඳහා යන වියදම සභා අරමුදලින් දැරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. යටලමත්ත නගරය ආසන්නයේ ඇල්පිටිය වතු සමාගමට අයත් නාගොඩවත්ත කොටසින් ලබා ගත් පර්චස් 20 ක භූමියේ අත්පන්දු ක්‍රීඩාපිටියක් සකස් කිරීම සඳහා යෝජනා කරන අතර, ඒ සඳහා යන වියදම අවශ්‍ය වුවහොත් සභා අරමුදලින් දැරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

05. j.c.b. යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් සෙනොක් ට්‍රේඩ් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය සමඟ සාකච්ඡා කරනු ලදුව, 2019.03.06 දින සිදු කරන ලද පරික්ෂාව අනුව, ඔවුන්ගේ මාතර වැඩබිම වෙත රැගෙන ගොස් ගලවා බැලිය යුතු බවත්, යුනයිටඩ් මෝටර්ස් ආයතනය සමග සාකච්ඡා කරනු ලදුව ඔවුන්ද පවසා සිටියේ යන්ත්‍රය රැගෙන එන ලෙසයි. එසේ හෙයින් මෙම j.c.b. යන්ත්‍රය අළුත්වැඩියා කොට ධාවන තත්වයට ගෙන ඒම අපහසු කාර්යයක් බව පෙනී යන හෙයින්, සභාවට ඉදිරිපත් කොට සභා අනුමැතියෙන් වෙන්දේසි කොට විකිණීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

මේ සම්බන්ධයෙන් ඉහත ඉදිරිපත් කරන ලද යෝජනාවට විරුද්ධ බව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා යෝජනා කල අතර, ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ස්ථිර කරන ලදී

**චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කරමින්,**

j.c.b. යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සෙනොක් ආයතනය කරන්නෙ නැහැ. ඔබතුමාලා ඒ ආයතනය සමඟ ඒ සම්බන්ධයෙන් කතා කළාද?

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

ඔව් අපි පෞද්ගලිකව කතා කළා.

**චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කරමින්,**

ගරු සභාපතිතුමනි, කණ්ඩායමක් හැටියට ඔබතුමාලා සම්බන්ධ කර ගැනීමේ නොහැකියාව තමයි තිබුනෙ. මේක වෙන්දේසි කිරීමෙන් වෙන්නෙ දූෂිත ක්‍රියාවක් වැහෙන එක. ගිය සැරෙත් යන්ත්‍රය බැලීමට ආපු අය කිව්වා. සම්ප් එකත් ගලවලා කියලා. ඒ නිසා අපි අපගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්,**

ගරු මන්ත්‍රීවරුනි, මේක අද ඊයෙ වෙන්දේසි කරන්න ආපු යෝජනාවක් නෙමෙයි. මෙම වෙන්දේසි කරන යෝජනාව ඇවිත් තියෙන්නෙ 2014 වර්ෂයේ.

**චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කරමින්,**

ගරු සභාපතිතුමනි, ඔබතුමා නෙමෙයි. මේක භාරව සිටි නිලධාරියා තමයි විභාග කරනවා කිව්වෙ. රියදුරා නවත්තපු එක රියදුරාගෙ ලොග් සටහන්, හා මේ සම්බන්ධව පොලීසියෙ පැමිණිලි තියෙනවා. එම යන්ත්‍රෙය් කෑලි ගැලවීම සම්බන්ධව කිසිම වග විභාගයක් නැහැ. මුරකාරයො 7, 8 දෙනෙක් ඉන්නවා. පරීක්ෂණයකින් තොරව මෙතන වංචාවක්, දූෂණයක් වෙලා තියෙනවා. ඒ නිසා j.c.b. යන්ත්‍රය වෙන්දේසි කිරීම සම්බන්ධයෙන් අපි විරුද්ධත්වය ප්‍රකාශ කරමින් යෝජනාවක් ගෙනෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

ගරු මන්ත්‍රීවරුනි, j.c.b. යන්ත්‍රය සම්බන්ධයෙන් චන්ද්‍ර සහබන්දු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ලක්ෂ 50 ක් දීලා හරි මේ යන්ත්‍රය අළුත්වැඩියා කරන්න කියලා. මම ආපු කාලයේ සිටම බලාපොරොත්තු වුනේ, j.c.b. යන්ත්‍රය අළුත්වැඩියා කොට පාවිච්චියට ගන්න. නමුත් ඒ කාලයේ ඒක කරගන්න අපට අපහසු වුනා. පසුව මම මහ ඇමතිතුමන් හා සාකච්ඡා කොට රී කන්ඩිෂන් (භාවිතා කළ) අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීමට අවසර ලබා ගත්තත්, රාජ්‍ය ආයතනවල වාහන අළුත්වැඩියා කිරීමට භාවිතා කල අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීමට අවසර නොමැති බව රජයේ නිලධාරීන් පැවසූ නිසා ඒ සඳහා විශේෂ අවසරයක් මාද ගරු මහ ඇමතිතුමාගෙන් ගැනීමට කටයුතු කළ මුත්, ඒ අවස්ථාවෙදිවත් j.c.b. යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට නොහැකි වුනා. මෙම යන්ත්‍රය මේ වන විට අළුත්වැඩියා කිරීමේ තත්වයක නැහැ. ඒ නිසා තමයි එය වෙන්දේසි කරන්න යෝජනා කළේ. සභාවේ

වැඩිපුර මන්ත්‍රීවරු පිරිසකගෙ කැමැත්ත තිබුනෙත් මෙම යන්ත්‍රය වෙන්දේසි කරනවට. ඒ අනුව තමයි මම මෙම යන්ත්‍රය වෙන්දේසි කිරීමට යෝජනා කලේ. එක් පාර්ශවයක් කියනවා. වෙන්දේසි කල යුතුයි කියලා. අනෙක් පාර්ශවය කියනවා. වෙන්දේසි නොකළ යුතුයි කියලා. ඒ අනුව ඡන්දයක් පැවැත්වීමට මම තීරණය කරනවා.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙම යෝජනාව සම්බන්ධයෙන් ඡන්දයකට යාම සිදු කරන ලදී. එහිදී ගරු සභාපතිතුමා විසින් සභිකයන්ට අත් එසවීමෙන් ඡන්ද ප්‍රකාශ කරන ලෙස දැණුම් දෙන ලදී. මෙම යෝජනාවට පක්ෂව ඡන්ද 12 ක් ලැබුණු අතර, විපක්ෂව ඡන්ද 3 ක් ලැබිනි. 01 නියෝජිතවරියක් ජන්දය පාවිච්චි කිරීමෙන් වැළකී සිටින ලදී. ඉතිරි මහජන නියෝජිතයන් 09 දෙනා මෙම ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව (පෙ.ව. 10.00 න් පසු) සභා ගර්භයට පැමිණෙන ලදී.

**යෝජනාවට පක්ෂව ඡන්දය ඉදිරිපත් කරන ලද මහජන නියෝජිතයින්**

1. ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා
2. ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා
3. ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා
4. ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය
5. ගරු මන්ත්‍රී සී. වනිගරත්න මහතා
6. ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය
7. ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා
8. ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්දු මහතා
9. ගරු මන්ත්‍රී නාපෙ විතානගේ සමන් මහතා
10. ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා
11. ගරු මන්ත්‍රී ඒ.එච්.වී. අජිත් කුමාර මහතා
12. ගරු මන්ත්‍රිනී ඩබ්.කේ.නෙලී මහත්මිය

**යෝජනාවට විපක්ෂව ඡන්දය ඉදිරිපත් කරන ලද මහජන නියෝජිතයින්**

1. සී.වී. සහබන්දු මහතා — ගරු මන්ත්‍රී
2. එච්.ජී. තරංග සුදර්ශන මහතා — ගරු මන්ත්‍රී
3. කුමාරගේ වසන්ත මහතා — ගරු මන්ත්‍රී

**ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි මහජන නියෝජිතයින්**

1. කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය — ගරු මන්ත්‍රිනී

**ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව (පෙ.ව. 10.00 න් පසු) සභා ගර්භයට පැමිණෙන ලද මහජන නියෝජිතයන්**

1. එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා — ගරු මන්ත්‍රී
2. එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා — ගරු මන්ත්‍රී
3. ඩබ්. ජී. නිශාන්ත මහතා — ගරු මන්ත්‍රී
4. කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය — ගරු මන්ත්‍රිනී
5. බන්දුල සමන්ත හිරිමුතුගොඩ — ගරු මන්ත්‍රී
6. විලේගේ අමර ධනංජය මහතා — ගරු මන්ත්‍රී
7. කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය — ගරු මන්ත්‍රිනී
8. කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය — ගරු මන්ත්‍රිනී

9. එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය ගරු මන්ත්‍රිනී

**ඒ අනුව මෙම යෝජනාවට පක්ෂව වැඩි ඡන්ද 8 ක් හිමිවිය.**

**ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට සමීක්ෂණ මණ්ඩලය පත් කිරීමට යොජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07. දකුණු පළාත්, පළාත් පාලන බල ප්‍රදේශවල පිහිටි ක්‍රීඩා භූමි සඳහා ප්‍රතිපාදන ලබාදීම යටතේ පහත සඳහන් ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමට යෝජනා කරමි.( අනුමත ප්‍රතිපාදන මුදල රු. ලක්ෂ 10)

i. උඩුගම දකුණ ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම
ii. මුලන ආනන්ද ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම
iii. උනන්විටිය දිවා රාත්‍රී ක්‍රීඩා පිටිය සඳහා විදුලිය ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

08. අනිකුත් සංවර්ධන කටයුතු සඳහා වෙන් කර ඇති රු. ලක්ෂ 05 ක මුදලින් අලවත්තවිල, හුංගමගෙදර, මාතර ගෙදර හරහා කුරුපනාව මරණාධාර සමිතිය මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

09. 2022 වර්ෂයට අදාලව නාගොඩ ප්‍රාදේශීය සභා අයවැය කෙටුම්පත සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

10. 2021 පළාත් නිශ්චිත සංවර්ධන සැලැස්ම යටතේ නාගොඩ පිටෝවිට මුහන්දිරම් වතුරාව මාර්ගයේ පෙට්ටි බෝක්කුව ඉදිකිරීම සඳහා රු. ලක්ෂ 5 ක ප්‍රතිපාදන වෙන්කර ඇති නමුත් නව මිළ ගණන්වලට ඇස්තමේන්තු සැකසීමේදී සමස්ත ඇස්තමේන්තු වටිනාකම ලක්ෂ 6 ක් විය. ඒ අනුව වැඩිවන ලක්ෂයක මුදල සභා අරමුදලින් දැරීමට යෝජනා කරමි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

11. තල්ගස්වල සති පොළ සංවර්ධනය කිරීමේ කර්මාන්තය හා උඩුගම සති පොළ සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ කොන්ත්‍රාත්කරුවන් විසින් කාලය දීර්ඝ කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. එම කාලය දීර්ඝ කිරීම් අනුමත කරන ලෙස යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

12. ආදාහනාගාරය ඉදිකිරීම හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීම යන ව්‍යාපෘතිවල අත්තිකාරම් මුදල් ගෙවීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතුව පළාත් සභා හා පළාත්පාලන රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. ඒ අනුව අමාත්‍යාංශයෙන් මුදල් ලද පසු පහත අත්තිකාරම් ගෙවීමට අනුමැතිය ඉල්ලීමට යෝජනා කරමි.

ආදාහනාගාරය සඳහා - රු. 13,497,987.59

වෙළඳ සංකීර්ණය සඳහා - රු. 2,755,274.08

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

13. නාගොඩ ප්‍රාදේශීය සභාවේ අවසන් ගිණුම් සකස් කිරීම සම්බන්ධව පුහුණු වැඩසටහන සඳහා නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්තුමියගේ දැණුම්දීම මත තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සේවය කරනු ලබන කළමනාකරණ සේවා නිලධාරී එල්.එම්. චතුර ජයාත්ම මහතාට 2021/11/10 හා 11 දින සඳහා සම්පත් දායක දීමනාව හා ගමන් වියදම් දීමනාව සභා අරමුදලෙන් ගෙවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**14. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 48 දක්වා ගෙවීම් සභා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

**2021.11.09 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2021 ඔක්තෝම්බර් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු.8488.85 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 752.40 |
| 4501090200 | - මාපලගම වෙලද සංකීර්ණ කොරිඩෝව | - රු. 313.20 |
| 4507357802 | - සමනළ පෙර පාසල | - රු. 240.00 |
| 8617046104 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය | - රු. 441.30 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 789.00 |
| 450908908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 697.50 |
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 276.60 |
| 4599064300 | - ගෝණදෙනිය පෙර පාසල | - රු 276.60 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 276.60 |

4594810314 - තල්ගස්වල සති පොළ - රු. 276.00

**2021 සැප්තැම්බර් මස විදුලි බිල්පත්**

8616374000 - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් - රු. 240.00
8616373802 - උඩුගම පොළ හෝම්දොළ - රු. 240.00
2810125104 - දීප්ති පෙර පාසල - රු. 258.30

**02. ලංකා විදුලිබල මණ්ඩලය**
කැකුළු පෙර පාසලේ ගොඩනැගිල්ලෙහි 2021 ජනවාරි මස සිට ඔක්තෝම්බර් දක්වා විදුලි බිල්පත් පියවීම - රු. 2866.92

**03. 2021 සැප්තැම්බර් මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**
i. 0912231201 - සභාපතිතුමාගේ නිවස - රු. 5073.51

**2021 අගෝස්තු මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**
i. 0912231201 - සභාපතිතුමාගේ නිවස - රු. 4712.66

**2021 ජූලි මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**
i. 0912231201 - සභාපතිතුමාගේ නිවස - රු. 5017.56

**04. සී/ස ලංකාබෙල් සමාගම**
2021.09.16 සිට 2021.10.15 දක්වා උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම- රු. 613.00

**05.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**
33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය
(2021.09.30 – 2021.10.22) - රු. 387.83

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය
(2021.09.30 – 2021.10.22) - රු. 593.64

**<u>06.2021 ඔක්තෝම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |
| කේ.ඒ.එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5500.00 |
| නදුන් ප්‍රමෝද් මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5500.00 |
| අනුෂා සමරවික්‍රම මෙය | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 3000.00 |

**<u>2021 සැප්තැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| කේ.ඒ.එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5500.00 |
| නදුන් ප්‍රමෝද් මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5500.00 |
| අනුෂා සමරවික්‍රම මෙය | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 3000.00 |

**07.2021 ඔක්තෝම්බර් මස ගමන් වියදම්**
**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - සභාපති | - රු. 2000.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 5600.00 |
| කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 1462.00 |
| ශ්‍රියානි කිරින්දගේ මිය | - පුස්තකාලයාධිපති | - රු. 870.00 |
| සෙව්වන්දි මනම්පේරි මිය | - පුස්තකාලයාධිපති | - රු. 860.00 |
| බී.ඩී.එල්.දිල්රුක්ෂි මිය | - පුස්තකාලයාධිපති | - රු. 860.00 |
| ඩබ්.ආර්.අනුෂි වසන්තිකා මිය | - පුස්තකාල සහායක | - රු. 870.00 |
| ධනංජනී පතිනායක මිය | - පුස්තකාල සහායක | - රු. 860.00 |
| වයි.ජී.ගංගා පද්මිනී මෙය | - පුස්තකාල සහායක | - රු. 870.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1410.00 |

**2021 සැප්තැම්බර් මස ගමන් වියදම්**
**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 540.00 |

**08. අතිකාල දීමනා ගෙවීම්**
**2021 ඔක්තෝම්බර් මස**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9136.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 2354.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 5243.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු.10143.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 4494.00 |
| එන්.එම්.රජිත් මයා | - අනියම් මුරකරු | - රු. 4141.00 |
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - විදුලි කාර්මික | - රු. 1365.00 |
| කේ.එම්.එම්.නිශාන්ත ඉඳුනිල් මයා | - රියදුරු | - රු. 8560.00 |
| ජී.එල්.උපුල් ධර්මසිරි මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 884.00 |
| එම්.ඩබ්.හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 4160.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 3171.00 |

**2021 සැප්තැම්බර් මස**

| | | |
|---|---|---|
| එන්.එම්.රජිත් මයා | - අනියම් මුරකරු | - රු. 1010.00 |

**09. අනූෂා සමරවික්‍රම මෙය, තාක්ෂණ නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව**
සති අන්ත නිවාඩු දිනයන්හි රාජකාරියේ යෙදීම වෙනුවෙන් දීමනා ගෙවීම - රු. 2714.00
(2021 ඔක්තෝම්බර් මාසය සඳහා)

**10. කේ.එල් නදුන් ප්‍රමෝද මයා, තාක්ෂණ නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව**
සති අන්ත නිවාඩු දිනයන්හි රාජකාරියේ යෙදීම වෙනුවෙන් දීමනා ගෙවීම - රු. 4656.00
(2021 ඔක්තෝම්බර් මාසය සඳහා)

**11. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**
i. 2021 සැප්තැම්බර් මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු.81000.00

ii. සභාපතිතුමාගේ රාජකාරි අවශ්‍යතාවයන් සඳහා PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ගෙවීම් - රු. 1800.00

iii. 2021.04.23 දින නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයින් වෙත දීමනා ගෙවීම - රු. 2500.00

iv. 2021.10.26 දින නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයින් වෙත දීමනා ගෙවීම - රු. 3000.00

**12. එම්.ඒ.ඩිලානි චනද්‍රප්‍රභා මිය,**

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක sp/psc/07/01/08(76) හා 2021.05.17 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් දීමනා ගෙවීම - 2021 ඔක්තෝම්බර් - රු. 10395.00

**13. ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**

**<u>2021 සැප්තැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 461 ක් | - රු. 51171.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 250 ක් | - රු. 27750.00 |
| LL 7366 ජල බවුසරය ඩීසල් ලීටර් 50 ක් | - රු. 5550.00 |
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 80 ක් | - රු. 8880.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 35 ක් | - රු. 3885.00 |
| LL 7103 ටිපර් රථය සඳහා ඩීසල් ලීටර් 270 ක් | - රු. 29970.00 |
| LL 7103 ටිපර් රථය සඳහා ඩී එස් ඔයිල් ලීටර් 02 ක් | - රු. 1400.00 |
| LL 7103 ටිපර් රථය සඳහා හයිඩ්‍රොලික් ලීටර් 05 ක් | - රු. 3500.00 |
| ගබඩා කර තබා ගැනීම සඳහා පෙට්‍රල් ලීටර් 50 | - රු. 7850.00 |
| 2T Oil ලීටර් 2 | - රු. 1400.00 |
| මාසික සභා වාර්තා බෙදීම වෙනුවෙන් (පෙට්‍රල් ලීටර් 5) | - රු. 785.00 |
| **එකතුව** | **- රු.142141.00** |

**14. නීතිඥ හේමන්ත පී.ඩබ්ලිව් විතාරණ මයා, ලේන්බාන් වීදිය, කොටුව**

SP 138 දරණ නඩුවට අදාළව 2021.10.01 දින නීතිඥ පෙනී සිටීමේ ගාස්තු හා L 16242 නඩුවට අදාළව 2021.10.15 දින නීතිඥ පෙනී සිටීමේ ගාස්තු - රු. 8000.00

**15. එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2021 ඔක්තෝම්බර් - රු. 5940.00

**16.එම්.ඒ.සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, යටලමත්ත**

මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම

| | |
|---|---|
| 2021 අප්‍රේල් | - රු. 2220.00 |
| 2021 මැයි | - රු. 1740.00 |
| 2021 ජූලි | - රු. 1880.00 |
| 2021 අගෝස්තු | - රු. 700.00 |

**17. ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2021 ඔක්තෝම්බර් - රු. 6170.00

**18. A.J.G. ස්ටෙෂනරි, කලුවැල්ල, ගාල්ල**
ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 62320.00

**19. එස්.බී.ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්, මීගමුව**
ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍ය මුද්‍රිත ලේඛන ලබා ගැනීමේ බිල්පත - රු. 19900.00

**20. සරසවි බුක්ෂොප් ප්‍රයිවට් ලිමිටඩ්, ගාල්ල**
2021 වර්ෂය සඳහා පාඨක ඉල්ලීම මත නාගොඩ, මාපලගම, උඩුගම මහජන පුස්තකාල
තුන සඳහා පොත් මිලදී ගැනීමේ බිල්පත - රු.149970.90

**21. එච්.ජී.සමීර සම්පත් මයා, සමීර සැනිටයිසර්, නාගොඩ**
ප්‍රධාන කාර්යාලයට හා පුස්තකාල සඳහා සැනිටයිසර් ලබා ගැනීමේ බිල්පත - රු. 4800.00

**22. ජී.පී.සදුන් චතුරංග මයා, ඊබේස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම**

i. සංවර්ධන අංශයේ පරිගණක යන්ත්‍ර 3 හා ගිණුම් අංශයේ පරිගණක 2 අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 2900.00
ii. සංවර්ධන අංශයේ පරිගණක යන්ත්‍රයක් සඳහා මූසිකයක් ලබා ගැනීමේ බිල්පත - රු. 1100.00

**23. ඩී.සී.ආර්.ඇපා, කුමාර ඉලෙක්ට්‍රිකල්ස්, නාගොඩ**
උඩුගම උප කාර්යාලයේ පින්ගර් ප්‍රින්ට් එක සඳහා පවර් ඇඩප්ටරයක්
මිළදීගැනීමේ බිල්පත - රු. 690.00

**24. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල
බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා නොවැම්බර් මස මාසික කුලීය ගෙවීම- රු.5000.00

**25. විගණකාධිපති, විගණන කාර්යාලය**

i. හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**26. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
(2021 ඔක්තෝම්බර්) - රු.14500.00

**27. ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. 2021 ඔක්තෝම්බර් මස පැවති සභාවාරය සඳහා මහජන නියෝජිතයන් වෙනුවෙන් දුරකථන කාඩ්පත් ලබා දීමේ බිල්පත් පියවීම - රු.28500.00
ii. 2021 ඔක්තෝම්බර් මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2520.00

**28. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**

i. ප්‍රධාන කාර්යාලයේ දොරවල් සඳහා අවශ්‍ය කොන්ඩ් පට්ටම් හා පැඩ් ලොක් මිළදී ගැනීමේ බිල්පත - රු. 630.00

**29. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**
තාක්ෂණ නිලධාරීන් සඳහා අවශ්‍ය මිණුම් ටේප් 03 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 2835.00
තාක්ෂණ නිලධාරීන් සඳහා අවශ්‍ය ස්ටීල් ටේප් 03 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 1575.00

තණකොළ කපන යන්ත්‍රයේ අළුත්වැඩියාව සඳහා අවශ්‍ය උපාංග මිළදී ගැනීමේ බිල්පත - රු. 1330.00

**30. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව,**
PF 7360 කැබ් රථය රක්ෂණය කිරීමේ ගාස්තු - රු. 74852.95

**31. කේ.කේ.සුමිත් ප්‍රියංග මයා, ජනු කුෂන් වර්ක්ස්, යටලමත්ත**
LL 7650 කෘ කැබ් රථයේ ශීට් කුෂන් කිරීම , කාපට් යෙදීම හා
ඩෑෂ් බෝඩ් කවරය යෙදීමේ බිල්පත - රු. 27500.00

**32.නිව් විජය මෝටර්ස්, ඔරොප්පුවත්ත, ගාල්ල**
LL 7650 කෘ කැබ් රථය සඳහා අලුතින් ටයර් 3 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 55500.00
SPLL 7366 ට්‍රක් බවුසරය සඳහා අලුතින් ටයර් 6 ක් මිලදී ගැනීමේ බිල්පත - රු.235800.00

**33.ඩී.ජී.කැළුම් පුෂ්පකුමාර මයා, උඩුගම**

i. Spra 8569 ට්‍රැක්ටරයේ ඕල්ටර්නේටර් බ්‍රෂ් සෙට් දැමීම ඕල්ටර්නේටර් රෙගියුලේටර් දැමීම ඕල්ටර්නේටරය ගලවා රෙපයාර් කර සවි කිරීමට සහ වයර් පද්ධතිය සෑදීම සඳහා බිල්පත - රු. 5850.00
ii. Spra 8569 ට්‍රැක්ටරය සඳහා අලුතින් මීටරයක් දැමීම, හා බ්‍රේක් ඇජස්ට් කිරීම හා බ්‍රේක් ලිවර් පින් 2 ක් අලුතින් ලියවා ගැනීම වෙනුවෙන් දරන ලද බිල්පත - රු. 11950.00

**34. ආසිරි ටයර් ට්‍රේඩර්ස් ඇන්ඩ් ඔටෝ සර්විස්, මාපලගම**
LL 7366 දරණ බවුසරයේ ටයර් මාරු කිරීම සහ අමතර රෝදයේ හා පිටුපස වම්පැත්තේ එලියේ
රෝදයේ පැච් දැමීමේ බිල්පත - රු.3500.00

**35. ජයසුන්දර හාඩ්වෙයාර්, උඩුගම**
උඩුගම ඇප්තොප්වත්ත ජල මෝටරය සකස් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය
ලබා ගැනීමේ බිල්පත - රු. 1480.00

**36. ජී.ජී. කසුන් මධුසංඛ මයා, උඩුගම**
උඩුගම ඇප්තොප්වත්ත කොම්පෝස්ට් අංගනයට විදුලි කේතලයක් ලබා ගැනීමේ බිල්පත - රු. 1350.00

**37. සඳරු ග්‍රොසරි ඇන්ඩ් ග්‍රයින්ඩින් මිල්ස්, නාගොඩ**

i. ප්‍රාදේශීය සභාවේ 2021.10.12 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත - රු. 4403.00
ii. පුස්තකාල සඳහා අවශ්‍ය කපුරු බෝල පැකට් මිළදී ගැනීමේ බිල්පත - රු. 630.00

**38. එම්.ටී.ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**

i. ප්‍රාදේශීය සභාවේ 2021.10.12 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 6320.00

**39. ආර්.ජ්.රංජිත් මානෙල් මයා, හොටෙල් සීගිරි, නාගොඩ**

පාසල් නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් කරන ලද සාකච්ඡාව සඳහා
සංග්‍රහ වියදම් ගෙවීම (කෑම සඳහා) - රු. 1800.00

**40. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, නාගොඩ**
පාසල් නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් කරන ලද සාකච්ඡාව සඳහා
සංග්‍රහ වියදම් ගෙවීම - රු. 2507.00

**41. මුරගල ඇඩ්වර්ටයිසින් ක්‍රියේෂන්, ගාල්ල**
සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද භාවිතය පිළිබඳ උපදෙස් ඇතුලත් දැන්වීම් පුවරු පාසල්වල
ප්‍රදර්ශනය කිරීම සඳහා - රු. 14040.00

**පොදු අරමුදල්**
**42. පී.වානක රංග, වානක එන්ටර්ප්‍රයිසස්, කහඳුව**
උඩවැලිවිටිතලාව - ගල්ලෙනමුල්ල මුක්තවිල මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රය යොදා
සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 37500.00
යෝජිත වලකුඹුර ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය හා භූමිය සකස් කිරීමට
ජේ.සී.බී. යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 82000.00

**43. වසන්ත කෝන්ගහගේ**
උඩවැලිවිටිතලාව - ගල්ලෙනමුල්ල මුක්තවිල මාර්ගය සංවර්ධනයට කොරි පස්
සැපයීමට ටිපර් රථය ලබා දීම වෙනුවෙන් ගෙවීම් - රු. 7500.00

**44. අසංක ගොඩනැගිලි ද්‍රව්‍ය , උඩවැලිවිටිතලාව**
උඩවැලිවිටිතලාව - ගල්ලෙනමුල්ල මුක්තවිල මාර්ගය සංවර්ධනයට කොරි පස්
සැපයීම වෙනුවෙන් ගෙවීම - රු. 24000.00

**45. පී.ජී. කසුන් ඉන්දික, බද්දේගම**
උඩවැලිවිටිතලාව කොණ්ඩුගොඩකන්ද මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රය යොදා
සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 18200.00

**46. අයි.පී.එන්.ජී. විකුම් සුරංග මයා, විකුම් කන්ස්ට්‍රක්ෂන්, උඩුගම**
උඩුගම සති පොළ කඩ කාමර ඉදිකිරීම 2අදියර යටතේ වැලි කියුබ් 01 ක් මිළදී ගැනීම
වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 13500.00

**47. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**
උඩුගම සති පොළ කඩ කාමර ඉදිකිරීම 2අදියර යටතේමිලදී ගත්
සිමෙන්ති සඳහා ගෙවීම - රු. 2850.00

**48. කේ.ජී තරංග මයා, වත්තෙ ගෙදර, නාගොඩ**
තල්ගස්වල රාජ්‍ය වැවිලි සංස්ථාව මැද කොටස ක්‍රීඩා පිටිය සංවර්ධනය, අලුත් පහල නො.20,
4 පටුමග සංවර්ධනය, නො.20 කුඹුරුහේන මාර්ගය සංවර්ධනය, රණවිරුගම
කොස්ගහ බංගලාව පාර සංවර්ධනය සඳහා ජේ.සී.බී. යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන්
මුදල් ගෙවීම - රු.137500.00

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

පාසල් විවෘත කිරීම සඳහා කොට්ඨාසෙ මන්ත්‍රීවරු කැඳවලා ප්‍රදේශයේ පාසල්වල කොට්ඨාස මට්ටමින් පිරිසිදු කිරීම් හා විසබීජහරණ කටයුතු සිදු කරන්න අපට සිදු වුනා.

**තරංග මන්ත්‍රීතුමා අදහස් දක්වමින්,**

ගරු සභාපතිතුමනි, සත්භාවයෙන් ජාතික කටයුත්තක් කරද්දි ඇයි අපට කතා නොකළෙ. රට පුරා උද්ඝෝෂන මාලාවක් ඇති වුනා. අපි හිතනවා ඒ උද්ඝෝෂණ මාලාවෙ වර්ධනය තමයි ඔබතුමාලා ඔය කලේ කියලා.

**ලක්රුවන් මන්ත්‍රීතුමා අදහස් දක්වමින්,**

ඒ අනුව පාසල් නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් අපි සියළු දෙනාම පීඩනයට පත් වෙලා සිටින අවස්ථාවක පොදුවේ හැම පාසලක්ම නීත්‍යානුකූලව ආරම්භ කිරීම සම්බන්ධයෙන් අපි සතුටු වෙනවා.

**අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමා අදහස් දක්වමින්,**

ගරු සභාපතිතුමනි, රජයේ කණ්ඩායමට විරුද්ධව සංග්‍රහ වියදම සම්බන්ධයෙන් කතා කරන්න ලැබීමත් ලැජ්ජාවට කරුණක්. හැබැයි ඔබතුමා අපි කැඳව්වෙ නැහැ. ඒ සම්බන්ධව අපිව කැඳවන්න අවශ්‍ය නැහැ කියලා ප්‍රකාශ කළා නම්, දකුණු පළාත් ගරු ආණ්ඩුකාර විලි ගමගේ මැතිතුමාට විරුද්ධව , ඔබතුමාටත් විරුද්ධව අපි ඡන්දය ප්‍රකාශ කරනවා.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

ආණ්ඩුකාරතුමා ප්‍රකාශ කරලා තිබුනා. පාසල් විවෘත කිරීමේ කටයුත්තට උදව් වෙන්න කියලා. කොට්ඨාස මන්ත්‍රීවරු කැඳවලා අපි කළේ ඒ දේ. එහෙම නැතිව ගරු ආණ්ඩුකාරතුමා එවැනි ප්‍රකාශයක් කලේ නැහැ.

**මෙහිදී ඉදිරි ගෙවීම් වාර්තාවේ අංක 39,40 යනුවෙන් සඳහන් ඉදිරි ගෙවීම් දෙක හැර අනිකුත් ඉදිරි ගෙවීම් පමණක් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බවට ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා යෝජනා කල අතර, ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ස්ථිර කරන ලදී.**

**ඉන් අනතුරුව මේ සම්බන්ධයෙන් ඡන්දයක් පැවැත්වීම සුදුසු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

එහිදී සභාපතිතුමා විසින් සභිකයන්ට අත් එසවීමෙන් ඡන්ද ප්‍රකාශ කරන ලෙස දැණුම් දෙන ලදී. මෙම යෝජනාවට පක්ෂව ඡන්ද 13 ක් ලැබුණු අතර, විපක්ෂව ඡන්ද 9 ක් ලැබිනි. ඉතිරි මහජන නියෝජිතයන් 04 දෙනා මෙම ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව සභා ගර්භයට පැමිණෙන ලදී.

**යෝජනාවට පක්ෂව ඡන්දය ඉදිරිපත් කරන ලද මහජන නියෝජිතයින්**

1. එම්.කේ. ගාමිණී සුසන්ත මහතා ගරු උප සභාපති
2. එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා ගරු මන්ත්‍රී
3. ධර්මසිරි ගනේවත්ත මහතා ගරු මන්ත්‍රී
4. පියල් හිරිමුතුගොඩ මහතා ගරු මන්ත්‍රී
5. සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය ගරු මන්ත්‍රිනී
6. එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා ගරු මන්ත්‍රී
7. සී. වනිගරත්න මහතා ගරු මන්ත්‍රී
8. ප්‍රියන්තා ගුණසේකර මහත්මිය ගරු මන්ත්‍රිනී
9. එන්.ඩබ්. පතිනායක මහතා ගරු මන්ත්‍රී
10. විජිත් වීරගුණරත්න සහබන්දු මහතා ගරු මන්ත්‍රී
11. නාපෙ විතානගේ සමන් මහතා ගරු මන්ත්‍රී
12. ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ගරු මන්ත්‍රී
13. ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා ගරු මන්ත්‍රී

**යෝජනාවට විපක්ෂව ඡන්දය ඉදිරිපත් කරන ලද මහජන නියෝජිතයින්**

1. ඒ.එච්.වී. අජිත් කුමාර මහතා ගරු මන්ත්‍රී
2. ඩබ්. ජී. නිශාන්ත මහතා ගරු මන්ත්‍රී
3. සී.වී.සහබන්දු මහතා ගරු මන්ත්‍රී
4. එච්.ජී. තරංග සුදර්ශන මහතා ගරු මන්ත්‍රී
5. කුමාරගේ වසන්ත මහතා ගරු මන්ත්‍රී
6. කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය ගරු මන්ත්‍රිනී
7. කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය ගරු මන්ත්‍රිනී
8. කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය ගරු මන්ත්‍රිනී
9. එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය ගරු මන්ත්‍රිනී

**ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි මහජන නියෝජිතයින්**

1. ගරු මන්ත්‍රිනී ඩබ්.කේ.නෙලී මහත්මිය ගරු මන්ත්‍රිනී

**ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව (පෙ.ව. 10.30 න් පසු) සභා ගර්භයට පැමිණෙන ලද මහජන නියෝජිතයන්**

1. අමර ධනංජය විලේගේ මහතා ගරු මන්ත්‍රී
2. බන්දුල සමන්ත හිරිමුතුගොඩ ගරු මන්ත්‍රී

ඒ අනුව මෙම යෝජනාවට පක්ෂව වැඩි ඡන්ද 4 ක් හිමි විය.

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. උඩවැලිවිටිය ගල්ලෙනමුල්ල ප්‍රධාන මාර්ගය පැති කාණු කපා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. ගල්ලෙනමුල්ල දරඅකුල්කන්ද පාමුල මාර්ගය සඳහා අඩි 1 1/2 හියුම් පයිප්ප 2 ක් ලබා ගැනීම
**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යා කරන මාර්ගය , ශ්‍රමදාන මාවත, රතුමිල්ලවල කුරුඳු කොලණිය ෆයිනස්කන්ද දක්වා මාර්ගය යන මාර්ග ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා පැති කාණු කපා කොරිපස් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. උනන්විටිය ශ්‍රී රේවත මහා විද්‍යාලයේ ක්‍රීඩාංගනයේ ඉදි වෙමින් පවතින දිවා රාත්‍රී වොලිබෝල් පිටියට විදුලිය ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. 211 බී උනන්විටිය නැගෙනහිර, ප්‍රජා මණ්ඩල දෙමහල් ගොඩනැගිල්ලට විදුලිය ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ) 2. 1. 11(8) යටතේ ඉදිරිපත් කරන යෝජනා**

**ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. පසුගියදා ඇදහැලුනු අධික වර්ෂාව නිසා මාගේ කොට්ඨාසයේ මාර්ග කිහිපයක්ම පස් කඳු කඩා වැටී අවහිර වී ඇති බැවින් ඉතා ඉක්මණින් එම මාර්ග නිදහස් කර දෙන ලෙස යෝජනා කරමි.

- ගෝණදෙනිය 210 ඊ ග්‍රාම සේවා වසමේ පාසල්ගොඩකන්ද සිට රුක්මල්දෙනිය දක්වා දිවෙනඅතුරු මාර්ගය
- ගෝණදෙනිය 210 ඊ ග්‍රාම සේවා වසමේ පාංකඩේ අසළ සිට බණ්ඩිහේන වත්ත දෙසට දිවෙන රුක්මල්ගහදෙණිය මාර්ගය
- ගෝණදෙනිය 210 ඊ ග්‍රාම සේවා වසමේ ඔසුහල අසළ සිට 72 කන්ද දක්වා දිවෙන මාර්ගය

**ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

මෙහිදී වැඩි දුරටත් අදහස් දක්වමින්, මෙය පොදු ප්‍රශ්ණයක් බැවින්, කොට්ඨාස 15ටම ජේ.සී.බී. පැය ගණනක් ලබා දීම සුදුසු බව ගරු උප සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. 212 කැප්පිටියාගොඩ දකුණ ග්‍රාම සේවා වසමට අයත් අත්කම් නිවාස ආදාහනාගාරය සඳහා ගමන් කරන මාර්ගයේ මඩ ඉවත් කොට කොරිපස් දමා තාවකාලික ලෙස සංවර්ධනය කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. 219 ඩී අලුත්වත්ත ග්‍රාම නිලධාරී වසමට අයත් 18 කන්ද මාර්ගයේ කොටස ඉතා අබලන් වී ඇති බැවින්, 18 කන්ද මාර්ගයේ සුළු කොටස සහ බොසේජු කොටස යන මාර්ගයේ කාණු පද්ධතිය සහ මාර්ගය මැද ඇති වලවල් පිළිසකර කිරීමට දළ වශයෙන් ජේ.සී.බී පැය 12 ක් පමණ යන බැවින්, එම ජේ.සී.බී පැය 12 ක් ලබා දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02.උඩුගම නැගෙනහිර 219 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පහත සඳහන් මාර්ග ප්‍රාදේශීය සභාවට පවරා ගන්නා මෙන් යෝජනා කරමි.

කටුවත්තගොඩැල්ල පාර -අම්බලන්පිටිදොළ පාලමේ සිට බංගම මාර්ගය දක්වා
ගුණානන්ද මාවත සුදුවැලිපොත ගුලනකන්ද හරහා ජනසවිය ගම්මානය දක්වා
පැහිරිහේන මාර්ගය
ඇත්ගාලවල පාර
අක්කර 80වටරවුම් මාර්ගය

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

මෙහිදී ගරු සභාපතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ සභාව සතු මාර්ග සහ ඉඩම් පවරා ගැනීමට නිලධාරියෙකු පත් කර ඉදිරි කටයුතු කල යුතු බවයි.

3. ගොවි නිශ්පාදන එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වෙන් වී ඇති රු. ලක්ෂ 35 ක් පමණ වන මුදලින් ප්‍රජා ශාලාව ඉදිකර ඇති භූමියේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ) 3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. බණ්ඩාරනායකපුර බහුකාර්යය මධ්‍යස්ථානයේ ක්‍රීඩා පිටිය J.C.B. යන්ත්‍රයක් යොදවා සංවර්ධනය කිරීම - රු. 65000.00
02. අලුත්වත්ත ග්‍රාම නිලධාරී වසමේ සුදුවැලිපොත මංසන්ධියෙන් ගම්මානයට ප්‍රවේශවන මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදවා සංවර්ධනය කිරීම - රු. 25000.00
03. දිමුතු වෙලදසැල මයියොක්කාහේන මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදවා සංවර්ධනය කිරීම - රු. 62500.00
04. යටලමත්ත මාමනදොළ 40 කන්ද මාර්ගය සංවර්ධනය කිරීම - රු. 15000.00
05. උඩුගම දකුණ ක්‍රීඩාංගනය J.C.B. යන්ත්‍රයක් යොදවා සංවර්ධනය කිරීම - රු. 40000.00
06. 216 ඒ නාගොඩ ඉහළ පුවක්ගහහේන ගල්මුල්ල මාර්ගය සංවර්ධනය කිරීම - රු. 200000.00
07. ඇප්තොප්වත්තේ කුරුඳු පැළ සිටුවීම සඳහා බිම් සකස් කිරීම - රු. 104000.00
08. පිටෝවිට මුහන්දිරම් වතුරාව මාර්ගයේ පෙට්ටි බොක්කුව ඉදිකිරීම - රු. 600000.00
09. ඇටඹගහවිල කෘෂි මාර්ගයේ දොලේකඩේ පිවිසුම අසළ සපත්තු පාලම ඉදි කිරීම - රු. 200000.00
10. උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යාකරන මාර්ගය කොරිපස් යොදා සංවර්ධනය කිරීම - රු. 25000.00
11. ගෝණදෙනිය අම්බලම අසළින් ගෝණදෙනිය දිසානායක මාවතට සම්බන්ධ වන මාර්ගයේ ඇති ඇළ හරහා යොදා ඇති යකඩ පාලම සංවර්ධනය කිරීම - රු. 30000.00
12.උඩුගම නැගෙනහිර ඇටිකෙහෙල්කන්ද මාර්ගය සංවර්ධනය කිරීම - රු. 100000.00
13. ආදාහනාගාර පිවිසුම් මාර්ගය සකස් කිරීමේදී බාධකයක්ව පවතින කලු ගල බෝර ගසා ඉවත් කිරීම - රු. 150000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**ටයර් ඩැග් කිරීම සඳහා මිළ ගණන්**

| විස්තරය | සමන්ත ටයර් සෙන්ටර්, කරාපිටිය | විජේතුංග ගෘප් කම්පැනි, ගාල්ල | රුහුණු 2001, මාගාල්ල |
|---|---|---|---|
| 650 X 16 ටයර් | 6530.00 | 6260.00 | 6700.00 |
| 825 X 16 ටයර් | 9100.00 | 8625.00 | 9250.00 |
| 750 X 16 ටයර් | 7550.00 | 7209.00 | 7850.00 |
| 600 X 16 ටයර් | 5840.00 | 5643.00 | 5940.00 |
| 1000 X 20 ටයර් | 13500.00 | 12773.00 | 13000.00 |
| 900 X 20 ටයර් | 10100.00 | 9834.00 | 10200.00 |
| 825 X 20 ටයර් | 9800.00 | 9343.00 | 9850.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහනවල ටයර් ඩැග් කිරීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව ඒ සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබුනේ විජේතුංග ගෘප් කම්පැනි, ගාල්ල වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ වාහනවල ටයර් ඩැග් කිරීම සිදු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනි සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

**වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා**

ගරු සභාපතිතුමනි අවසරයි. පාසල් පටන් ගැනීම සම්බන්ධයෙන් කරුණු කිහිපයක් මේ සභාවේ කතා කරන්න ඕන. කියපු විදියට නියමිත දිනට පාසල් පටන් ගත්තා. ඒ ගැන දැන ගන්න දෙයක් තියෙනවා නම්, හෝමදොළ පාසලේ විදුහල්පතිතුමාගෙ නම්බර් එක දෙන්න පුළුවන්. කෙසේ වෙතත් නියමිත දිනට, නියමිත වෙලාවට, පාසල ආරම්භ කිරීමේ කටයුත්ත ඉතා හොඳින් සිදු වූ බව මේ අවස්ථාවේ ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, විශේෂයෙන්ම මම මේ අවස්ථාවේ j.c.b. යන්ත්‍රය වෙන්දේසි කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළ යුතුයි. ඒ සම්බන්ධව ඡන්දයක් තියන්න සිද්ධ වුණා. අපි ඒ අවස්ථාවේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට ඡන්දය ප්‍රකාශ කළා. මොකද පක්ෂයක් ඇඟේ ගාගෙන නෙවෙයි. j.c.b. එක ගැන මුල සිද්ධිය දන්න නිසා. ඒ j.c.b. එකට වෙන දෙයක් තියෙන්න ඕන. එක්කෝ මේක හදලා ගන්න ඕන. අවුරුදු 11ක් ගියා. වෙන්දේසි කරලා, එහි වටිනාකමට හරියන මුදලක් අයකර ගැනීමට. නමුත් එසේ සිදු වුනේ නැහැ. නමුත් මේ

සම්බන්ධව මුල ඉඳලම ඉල්ලපු පරීක්ෂණ වලට පළාත් පාලන ආයතනය විසින් නිසි ක්‍රමවේදයක් කිව්වේ නැහැ. එහෙමයි කියලා මේ යන්ත්‍රයට මොනාහරි දෙයක් තියෙන්න ඕන. යන්ත්‍රය විනාශ වෙන්න දෙන්නෙ නැතුව, මේක හදලා ප්‍රයෝජනයට ගන්න ඕන. නැතිනම් විකුණලා දාන්න ඕන. නමුත් මෙම යන්ත්‍රය හදන්න බැරි මට්ටමක තියෙනවා කියලා මට පේනවා. එහෙම හදනවා නම් කෝටියක විතර මුදලක් යනවා කියලා මට පේනවා. හැබැයි වෙන්දේසි කරනවා නම්, රුපියල් පන්ලක්ෂයකට විතර වෙන්දේසි කරන්න එපා දැන් යකඩ ලොකු මිලක්. j.c.b. යන්ත්‍රය වෙන්දේසි කරනවා නම්, මේක කොයි තරම් වටිනවද කියල සොයා බලලා, අබලි ද්‍රව්‍යයක් ලෙස යන්න දෙන්නෙ නැතුව යම් වටිනා මුදලක් සභාවට ලබා ගැනීමට කටයුතු කරන්න කියලා මේ අවස්ථාවේදී සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපි මේ අවස්ථාවේ ඡන්දය ප්‍රකාශ කළේ මේ යන්ත්‍රය සම්බන්ධයෙන් මොනවා හරි තීන්දුවක් ගන්න අවශ්‍ය නිසා. ඡන්දය නොදී සිටීමෙන් කිසිවක් වෙන්නේ නැහැ. ඒ නිසා ඒ කටයුත්තට උපරිම සහයෝගය ලබා දුන්නා.

අනිත් කාරණය, අපි මේ සභාවේ කටයුතුවලට හැම අවස්ථාවකදිම නිරන්තරයෙන් සහයෝගය ලබා දෙනවා. නමුත් පක්ෂයක් එක්ක හැමදාම හිටියා. හවුල්කාර පක්ෂය නිසා අපට හරි හවුල තියා, හවුලෙන් දූවිල්ලක්වත් ලැබිල නැහැ. නමුත් අපි ඒකට සහයෝගය ලබා දුන්නා. ජනාධිපතිතුමා පත් කිරීමේදී පවා ආණ්ඩුවට සහය දුන්නා. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් කිසිදු විනය පරීක්ෂණයක් සිද්ධ වෙන්නේ නැහැ. මොනම දේකටවත් දැන් ඔබතුමාලට විරුද්ධව ඡන්දය දුන්නා කියලා, ආයෙත් අහන්න අප කැඳවන්නේ නැහැ. කිසිදු විනය පරීක්ෂණයක් නැහැ. මොකද ඔබතුමාලා කරන වැරදි කටයුතුවලදී විරුද්ධ වෙන්න කියලා අපට පක්ෂයෙන්ම කියලා තියෙනවා. හැබැයි ඒ කිව්වේ මාස ගානකට කලින්. අපට ඕනෑම වේලාවකදී විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන කරන්න අපට බලය ලබා දීලා තියෙනවා. හවුල්කාර පක්ෂය ලෙස යම් යම් තැන්වලදී දරාගන්නවා. මොකද එක පක්ෂයකින් ඡන්දය ඉල්ලපු නිසා. සභාපතිතුමා ඔබතුමා ක්‍රියා කරන ආකාරය පිළිබඳ පැහැදීමක් තියෙනවා. හැබැයි සභාපති ලෙස ඔබතුමාගේ ක්‍රියාකලාපය කිසිවිටෙක අනුමත කළ යුතු තත්වයක නැහැ. ඔබ නාගොඩවිතාන ලෙස කටයුතු කළ නොහැකි නිසා වෙන්න ඇති. ඔබතුමාගේ පුද්ගලික නාමයට පවා අපකීර්තියක් එක්වී තියෙනවා. විපක්ෂ මන්ත්‍රීවරුන් පමණක් නොවෙයි. ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් පවා කලකිරීමෙන් ඉන්නේ. ගම් මට්ටමින් ගිහිල්ලා, මිනිස්සුන්ට යම් දෙයක් කරන්න තරම් දේවල් සභාවෙන් නොලැබෙන නිසා. අනාගතයේදී සභාව පවත්වන කාලය තුළ ඍජුවම ඔබ සමග ඉන්නවා කියලා හිතන්න එපා. මුදල් ගෙවීම් වාර්ථා වේ අංක 39, 40 ට විරුද්ධව ම නොවේ, විරුද්ධ වුණේ. තනිකරම අත ඉස්සුවෙ මේ ක්‍රියාවට විරුද්ධව. අපිත් මහජන නියෝජිතයෝ. ඒ නිසා ඉස්කෝලේ සම්බන්ධයෙන් අපටත් අයිතියක් තියෙනවා කතා කරන්න. ගුරුවරු වැඩට එනවද නැද්ද කියලා බලන්නත් අපට අයිතියක් තියෙනවා. සභාපතිතුමනි, මේ සියලු දෙනාම දෙමව්පියෝ. මේ තරංග මන්ත්‍රීතුමාගෙ දරුවො තාම පාසල් යනවා. මේ මේ හැමෝගෙම දරුවෝ පාසල් යනවා. මේ චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා මට ආරාධනා කළා නම්, පාසල සුද්ද කරන්න පැමිණෙන්න කියලා මම එනවා. ආණ්ඩුව අවසාන වශයෙන් හෝ පාසල් සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග විරුද්ධයි. මන්ත්‍රීවරු ටික, විදුහල්පතිවරු නැතුව පාසල අරින්න උත්සාහයක් ගන්නවා නම්, ඒ උත්සාහය නිවැරදි නැහැ. හේතුව ගේට්ටුව කඩලා පාසල විවෘත කිරීමේ කටයුතු කරන්න පුළුවන්. නමුත් ඒ ක්‍රියාදාමය සිද්ධ වෙන්නේ නැහැ. නමුත් මම ඒ ගුරුවරුන්ට ගෞරව කරනවා. මොකද 23 හෝ 25 හරි පාසල් යනවා කියලා එතුමන්ලා ගත්තේ තීරණයට. එහෙම නොවුනනම් ආණ්ඩුව විශාල ගැටලුවකට මුහුණ දෙනවා. මොකද නවක උපාධිධාරී පත්වීම් ධාරීන් දාලා, මොනතරම් පුහුණුවක් දෙන්නද? මොන ක්‍රියාදාමයක් හරහා ද මේ ගුරුවරු පුහුණුව ලබලා ළමයින්ට උගන්වන්න සුදුසුකම් ලබන්නේ. අපට ඒ ගැටලුව, ගැටුමකට යන්නේ නැතුව විසඳගන්න පුළුවන්. නමුත් ආණ්ඩුව සැර තීරණයක් ගන්න හැදුවත්, යම් ආකාරයකට එය පාලනය වීම ජාතියේ වාසනාවක් ලෙස දකිනවා. මේ අවුරුදු විසි ගානක් ඇදගෙන ආපු ප්‍රශ්නය බරපතල විෂමතාවක්. නමුත් ආණ්ඩුවත් ඉතා අමාරු තත්ත්වයක සිටින අවස්ථාවක, නමුත් මේ ප්‍රශ්නය විසඳීම සම්බන්ධව අපිත් අද සතුට පළ කර සිටිනවා.

ඒ වගේම චන්ද්‍රසිරි වනිගරත්න විදුහල්පතිතුමා උඩුගම නගරයේ දී කතාවක් කලාය යන්න මොනතරම් ශෙයා වුණාද? එතුමා මන්ත්‍රීවරයෙක් විතරක් නෙවෙයි. විදුහල්පතිවරයෙක්. වෘත්තිය අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරන්නත් ඕන. දේශපාලනඥයකු ලෙස කටයුතු කරන්නත් ඕන. එතුමා ආණ්ඩුවට විරුද්ධ කෙනෙක් නෙමෙයි. වෘත්තිය අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී හිටියා. මම ඒ සම්බන්ධව වැඩිදුර කතා කරන්න යන්නේ නැහැ.

ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා හැම කාරණයකදී ම අපි පක්ෂ ගණනාවක් මේ සභාව නියෝජනය වෙනවා. අපි 26 දෙනාගෙන්ම යම් අවස්ථාවකදී සහයෝගය ලබා ගන්න උත්සාහ ගන්න. සභාපතිතුමා ඉලක්කම් වලින් දිනන්න පුළුවන්. නමුත් විරුද්ධ නොවී ඉන්න කණ්ඩායමක් බවට පත් කරගන්න උත්සාහ කරන්න. මොකද සාධනීය සභාවක් ලෙස පවත්වාගෙන යන්න. ඔබතුමා දන්නවා. මේ සභාව කොතරම් වැදගත් මන්ත්‍රීවරුන්ගෙන් පිරි සභාවක් ද කියලා. ක මන්ත්‍රීවයෙක්වත් ඩෙස්ක් එකක් උඩ නැගලා ඉන්නවා. ඔබතුමා දැකලා තියනවද? සමහරු සභාවල ඩෙස්ක් උඩ නැගලා කරන දේවල් පේනවා නේද? නමුත් මේ සභාව අවුරුදු තිහක කාලයක් තිස්සේ, සියලුම සභාපතිවරුන්ගේ කාලය තුළදී මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය ආරක්ෂා කරගෙන යමින් පැවතිනි. අර්බුදකාරී තත්ත්වයක් උද්ගත වෙලා තිබෙද්දීත්, කෙතරම් විනයානුකූලව හැසිරුණ ද? මේ සභාව ඇත්තටම මහජන නියෝජිතයින් ජන ඡන්දයෙන් පත් වෙලා ආපු මේ මන්ත්‍රීවරුන් මිනිසුන් පිළිබඳ අදහසක් ඇති මිනිස්සු. මේ තරංග මන්ත්‍රිතුමා වනමල් මන්ත්‍රිතුමා, සහබන්දු මන්ත්‍රිතුමා, නන්දන මන්ත්‍රිතුමා ආදීන්ට ආදී අයට මාධ්‍ය ගෙන්වලා, ඩෙස්ක් උඩ නැගලා බොරු ෂෝ පෙන්නන්න පුළුවන්. නමුත් සැබෑ නියෝජිතයින්ගේ ගරුත්වය ආරක්ෂා කරගෙන කටයුතු කලා. ගරු සභාපතිතුමා, ඔබතුමා අපහසුතාවයට පත්වෙච්ච හැම අවස්ථාවකදීම, ඒ සහයෝගය දුන්නා. ඉදිරියටත් ඒ සහයෝගය දෙනවා. නමුත් සභාපතිතුමනි, අයවැය පරාද කරන්න ඕන තරම් සභාවලට සිදුවුණා. නමුත් සභාවේ කොහේවත් සඳහන් වුණේ නැහැ අයවැය පරද්දන්න. අපි ඔබතුමාට වත් ඔබතුමාලා අපටවත් අයවැය පරද්දන්න කටයුතු කලේ නැහැ. චන්ද්‍රසිරි වනිගරත්න මහත්මයාගේ යෝජනා වලට විරුද්ධව කටයුතු කරලා නැහැ. බලන්න නුවරඑළියෙ මන්ත්‍රීවරයෙක් ප්‍රසිද්ධියේ ආණ්ඩුව විවේචනය කරනවා. විපක්ෂයවත් එච්චර විවේචනය කරලා නැහැ. කොහොම වුණත් අපේ රටේ මේ වෙලාවේ ලොකු ප්‍රශ්නයක් තියෙනවා. නමුත් පොහොර අවශ්‍ය නම් මේ මිනිස්සුන්ට දෙන්න. වකුගඩුව නැති උනත් ප්‍රශ්නයක් නැහැ. ඒකට පස්සේ මොනවා හරි කරමු. අපේ ගම් වල මිනිස්සුන්ට තේ වගාව, කුරුඳු වගාව, වී වගාව මේ කිසිම දෙයක් කරගන්න විදිහක් නැහැ. පොහොර නැහැ. අඩුම වශයෙන් ගනුදෙනුවක් කරගන්න විදිහක් නැහැ. තේ දළු වලින් ආදායම් ගත්ත මිනිස්සුන්ට ඒවා නැති වෙලා. කොහොම නමුත් මේ ආණ්ඩුව යන ගමන් මග, යම් ප්‍රමාණයකට වෙනස් කරලා හෝ මේ ප්‍රශ්න විසඳන්න කටයුතු කරන්න කියලා, ඔබතුමන්ලා ඉහළ වගකිවයුත්තන්ට කියන්න. ප්‍රශ්න තියෙනවා. ඒ ප්‍රශ්න වලින් අඩුම ප්‍රශ්න තියෙන කොට්ඨාශය අලුත්වත්ත කොට්ඨාශයයි. මොකද අපි පොරකන්න යන්නෙ නැහැ. නමුත් දේශපාලනය තියෙන්නේ පොර කෑමක් තමයි. රාජා පොල්මුරේ මහත්මයා වැටුප් විෂමතාවය ඉවත් කරල වැටුප් වැඩිකරළ දෙන්න කියලා ඉල්ලනවා. චන්ද්‍රසිරි මහත්තයගෙ යෝජනාවට මේ සභාපතිතුමා, උප සභාපතිතුමා සමඟ මේ කාලය අවසන් වන තුරු යන්න ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. දිගින් දිගටම නොසලකනවනම්, ඔබතුමාටත් ප්‍රශ්න තියෙනවා. හැම මන්ත්‍රීවරයාම කැමතියි තමන් දිනපු කොට්ඨාසයට වැඩ කරන්න. ඒක දේශපාලනයේ හැටි. තව කාටවත් කරන්න දෙන්නෙ නැහැ. අලුත්වත්ත කොට්ඨාශයේ චන්ද්‍රසිරි මහත්තයා කතා කළොත් මම යනවා. වැඩේ එයාගෙ. යෝජනාවක් නම් මම එයාගේ යෝජනාවක් හැටියට ඊට අවශ්‍ය ශක්තිය දෙනවා. අපි අඳුරගත්ත දේශපාලනය, ඡන්දය නොදීම සම්බන්ධයෙන් යම් වේදනාවක් තියෙනවා. ඒ ඡන්දය නුදුන්නේ ඒ ක්‍රමවේදය ඉස්සරහට එහෙම නොවිය යුතුයි. මොකද කණ්ඩායම් නැතුව කළයුතු වැඩ තියෙනවා. නමුත් මේ ප්‍රශ්නෙදි කණ්ඩායම ගෙන්නලා කරන්න තිබුනා. අපි කවුරුත් පාසැල ගැන ප්‍රශ්නයට විරුද්ධ නැහැ. ආණ්ඩුවේ වැඩ කරන්න ගිහිල්ලා රාජා පොල්මුරේ ආණ්ඩුකාරතුමා අන්තිමට බැට

කැවා. මොකද එදා ඉඳලා වමේ දේශපාලනය කරන්න ගිහිල්ලා, ගුරු සටනට විරුද්ධව ප්‍රකාශ ඉදිරිපත් කරන්න ගිහිල්ලා. මේ ආණ්ඩුව රකින්න ගිහිල්ලා, අවලංගු කාසියක් බවට පත් වුනා. ගුරු පඩි වැඩි වෙන එකට එකඟයි. ඒ වගේම පඩි දෙපාරකට දෙන්න කියන එකටත් එකඟයි. ඒ මොකද මේ අවස්ථාවේ රට අමාරුවෙන් යන්නෙ. ආණ්ඩුව යන ගමන් මග සාර්ථක වෙන්න කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

නාගොඩ ප්‍රාදේශීය සභා ඉතිහාසයේ එක දිනයක් තුල යම් කාරණා සම්බන්ධයෙන් අවස්ථා දෙකකදී ඡන්දයක් පැවැත්වුනේ පළමු අවස්ථාවට එම අවස්ථා දෙකේදීම මම විරුද්ධව ඡන්දය දුන්නෙ සාධාරණව හිතලා. ඒ වගේම නාගොඩවිතාන සභාපතිතුමාගෙ මනුස්සකමත් එක්ක චන්ද්‍රසිරි වනිගරත්න මන්ත්‍රීතුමාගෙ වගේ කොන්දකුත් තිබුනනම්, අද නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වාසනාවන්තම ප්‍රදේශය වේවි. ඔබතුමාගෙ මනුස්සකම ගැන අපි කතා කරන දේවල් ඔබතුමා දන්නවනම්, ඔබතුමා අපට මෙහෙම කරන එකක් නැහැ. ඔබතුමා මන්ත්‍රී පුටුවෙ ඉන්න කාලෙ හිටපු විදියට දැනුත් ඉන්නවනම්, අපට මෙපමණ කතා කරන්න අවශ්‍ය වෙන්නෙත් නැහැ. වාර්තාව මෙතරම් දීර්ඝ වෙන්නෙත් නැහැ. අපේ කණ්ඩායම විතරක් නෙවේ. සමහර අවස්ථාවලදී ඔබතුමාගේ කණ්ඩායමත් ඡන්දය දෙන්නෙ, යෝජනා අනුමත කරන්නෙ රටේ ජනාධිපති, අගමැති දිහා බලලා. නමුත් අපි දෙයක් සම්මත කරනවනම්, හරි දේ හරි විදියටත්, වැරදි දේ වැරදි විදියටත් දකිනවා.

ඒ වගේම අද වන විට ගෙවල්වල දර ලිප් හදන්න වෙලා. බලන්න නාගරිකව මිනිස්සු කොතරම් අපහසුතාවයට පත් වෙනවද කියලා. ඌරල ළිඳේ ප්‍රශ්නය සම්බන්ධයෙන් පතිනායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා ලබන මාසෙ වන විට සිදු වුනේ නැත්නම් උද්ඝෝෂනය කරනවයි කියලා. නමුත් වුනේ නැහැ. මම වනිගරත්න මන්ත්‍රීතුමා ගැන නැවත වතාවක් කියන්නෙ, එතුමා කෙලින් කතා කරන, කෙලින් වැඩ කරන පුද්ගලයෙක්.

අද වාහනවල ලීසිං ගෙවාගන්න බැහැ. සල්ලි තියෙන මනුස්සයෙකුට වුනත්, ගෙයක් දොරක් හදාගන්න සිමෙන්ති නැහැ. අන්න ඒ වගේ ප්‍රශ්න තියෙනවා. මෙන්න මේ වගේ ප්‍රශ්න ගැන කතා කරන්න. බොරුවට කණ්ඩායම් රැස්වීම් තිව්වට වැඩක් නැහැ. කල යුතු දේ කරන්න. ඒ විතරක් නොවෙයි. කණ්ඩායමේ සාමාජිකයින් පවා අයවැය පරාද කරන්න කටයුතු කරපු අවස්ථාත් නැතුවම නොවෙයි.

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, පාසල්වල තණකොළ කැපුවා. සුද්ද කරා කිව්වා. නමුත් අපේ ප්‍රදේශයේ උඩුගම ප්‍රාථමිකයේ මගේ දරුවන් දෙන්නෙක් යනවා. මම පාසල් සංවර්ධන සමිතියේ සාමාජිකයෙක්. ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා. පාසල් වල තණකොල කැපීම සිදුකළා කියලා. නමුත් මම හොඳටම දන්නවා අපේ පාසලට එහෙම දෙයක් සිදු කළේ නැහැ. ඒ වගේම උඩුගම ප්‍රදේශයේ පාසල් වලට එහෙම කාර්යයක් සිදු කළේ නැහැ.

ඒ වගේම වනිගරත්න මන්ත්‍රිතුමා සම්බන්ධ වෙන්නේ ගුරු උද්ඝෝෂණයේ අරමුණ තමයි අධ්‍යාපනයට 6% ක් වැය කිරීම. මමත් දරුවන් වෙනුවෙන්, දෙමව්පියකු වශයෙන් මේ උද්ගෝෂණයට සම්බන්ධ වුනා.

2010 වර්ෂයේදි මගේ දරුවා උඩුගම ප්‍රථමිකයට ඇතුලත් කරන අවස්ථාවෙ FCID එකට කට උත්තර දෙන්න මටත් යන්න සිදු වුණා. කොහොම නමුත් ගුරුවරුන් අතර වැටුප් විෂමතාවයට සාධාරණයක් වෙන්න ඕන. ඔවුන්ගේ ඉල්ලීම් සාධාරණයි. අනිත් රාජ්‍ය නිලධාරීන් ලක්ෂ ගණන් පඩි ගනිද්දි, ගුරුවරුන් තිස් හතලිස්දාහක් වැනි සොච්චම් මුදලකට වැඩ කරනවා.

උඩුගම ප්‍රදේශයේ කැටගල් අල්ලපු පොලේ අඩියක් විතර මඩ තට්ටුවක් තියෙනවා. මෙය නිසියාකාරයෙන් නඩත්තු කරන්න කියලා ඉල්ලා සිටිනවා. පොළ අතුගාන්නෙ නැහැ. අපද්‍රව්‍ය නිසි පරිදි ඉවත් කරන්නෙ නැහැ. මිනිස්සුන්ගේ ඉල්ලීමක් තියෙනවා මේ කටයුතු කරලා දෙන්න කියලා. මොකද පොළෙන් අපට ආදායමක් එනවා. ඒවා රැක ගැනීම අපේ යුතුකමක්. ඒ වගේම පාරේ කානු සියල්ල ගොඩ වෙලා, වතුර බැහැලා යන්න ක්‍රමවේදයක් හදලා දෙන්න. පාරෙ ඇළ කණ්ඩිය කඩාගෙන යාම සිදු වෙනවා. සියලු කටයුතු නිසියාකාරයෙන් නඩත්තු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

සභා වාර්තාව ගැන ප්‍රකාශ කරන්න ඕන. සභා වාර්තාවෙහි කරුණු සටහන් වන්නේ බොහොම අඩුවෙන්. මොකද ගිය සභා වාර්තාවේදී වනිගරත්න මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා. නමුත් මම අහපු ප්‍රශ්නයක් වාර්තාවේ සඳහන් වුණේ නැහැ. ඒ වගේම අපි කිහිපදෙනෙක් සභාවෙන් නැගිටලා ගියා. එයත් වාර්තාවේ සටහන් වුණේ නැහැ. ඉලක්කම් ආදිය ගැටළු මතුවෙලා තියෙනවා. එවැනි ස්ථාන නිවැරදි කරන්න කියලා ඉල්ලා සිටිනවා.

උඩුගම ශ්‍රවණාගාර භූමිය, පාරක්. හරක් බල්ලො ආදී සතුන් එම භූමිය කැත කරනවා. ඒ වගේම එම භූමිය පුස්තකාලය අවට වල්බිහිවී ඉතා අප්‍රසන්න තත්ත්වයක් ඇතිවෙලා තියෙනවා. එම ශ්‍රවණාගාර භූමිය හරහා ගමකට යන පාරක් තියෙනවා. ශ්‍රවණාගාර භූමියේ තියෙන ගොඩනැගිල්ලේ පේමන්ට් එක උඩින් තමයි සමහර වාහන යන්නෙ. වැටක් හරි ගේට්ටුවක් දාන්න. ඒ වගේම පුස්තකාල භූමියට, ශ්‍රවණාගාරයට යන ළමුන් මෙම සතුන්ගෙන් පරිස්සම් කරගන්න ඕන. ඒය ඉතා අවධානම්. ඒ සඳහා විධිමත් වැඩපිළිවෙළක් යොදවන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ආදාහනාගාරයේ කටයුතු සමගම ආරම්භ කළ තල්ගස්වල වෙළෙඳ සංකීර්ණයේ වැඩකටයුතු, ආදාහනාගාරයේ කටයුතු වගේම සිදුවෙනවා නම් හොඳයි. ඒ ගැනත් සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම J.C.B යන්ත්‍රය ගැන කතා කරනවා නම්, අපි චන්දයකට ගියා අපි විරෝධතාවයත් දැක්වුවා. පැය හය දාහක් වැඩ කරපු මැෂින් එකක් ලක්ෂ පහකට වෙන්දේසි කරනවට විරුද්ධ වීම අපේ යුතුකම. මේක ප්‍රශ්න ගොඩක් තියෙනවා. ඒ වගේම මේ හේතුව නිසා රැකියාවක් අහිමි වෙලා තියෙනවා. පොලීසි පොතේ සටහන් වෙලා තියෙනවා. අනික තමයි j c b යන්ත්‍රය වෙන්දේසි කළොත්, අපට සිද්ධ වෙන්නේ මරණයක්, මරණ පරීක්ෂණයකින් තොරව, පුච්චලා දානවා වගේ කටයුත්තක්. මොකද සියල්ල ඒ තුළින් යට ගැහෙනවා. කිසිම දෙයක් හොයාගන්න බැහැ. සාක්ෂි ඔක්කොම වෙන්දේසියත් සමගම යටපත් වෙනවා. මේ වෙන්දේසිය කරනවා නම් පරීක්ෂණ ටිකට උත්තරයක් දීලා, ඒ කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

මේ වගේම ලබන සභාවේ අයවැය තියෙනවා. මොනවගේ තත්වයක් උදා වේවිද දන්නෙ නැහැ. මේ අවස්ථාව වන විට ගෑස් නැහැ. පොහොර නැහැ. බඩු මිළ අහස උසට නැගලා. මේ ප්‍රශ්ණ ගැන වගකිවයුතු ඉහළ නිලධාරීන් සමඟ කතා කරන්න ඔබතුමාගේ කණ්ඩායම මෙහෙයවන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා**

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාරයේදී වගේම අදත් අජිත් එඬේරආරච්චි මහත්මා අධ්‍යාපනය පිළිබඳ ඉතා වැදගත් දේවල් කතා කළා. ඒ වගේම ගිය සභාවේ මගේ ක්‍රියාකලාපය ගැන, මම පිළිබඳ ප්‍රශංසාත්මකව කතා කරල තියෙනවා. එය මට පෞද්ගලිකව සතුටක් ලැබෙන කරුණක් වුනත්, එම ප්‍රසංසාව නිසා අපේ සහෝදර මන්ත්‍රීවරුන් මා සමග අමනාප වෙනවා. තුවාලයක අමාරුව දන්නේ තුවාලය තියෙන කෙනා පමණයි. මෙම ප්‍රශ්නයේදී අපේ ගරු මන්ත්‍රී ලක්රුවන් මහත්මා මෙම ගරු

ප්‍රශ්නය හෙළා දැක්කා. මම අද මෙහෙම මෙතන ඉන්නේ මගේ ගුරුවරු නිසා. ඇත්තටම මම මේ අවස්ථාවේ මගේ ගුරුවරුන් සිහි කරනවා. ඒ වගේම අදටත් මම මගේ ගුරුවරුන්ට ගෞරව කරනවා. දේශපාලනික වශයෙන් අපට දීර්ඝ දේශපාලනයක් තියෙනවා. සමාජ තලය තුළ ඉඳගෙන යමක් කරන්න තමයි අපි දේශපාලනයට ඇවිත් තියෙන්නේ. අපි දරන දේශපාලන පක්ෂය වුණත්, යම්කිසි කාරණාවක් සම්බන්ධයෙන් වැරදි තීරණයක් අරගෙන තියෙනවා නම්, ඒ වෙනුවෙන් විරුද්ධ වෙන්න මම නැගී සිටිනවා. මම දේශපාලනික වශයෙන් කිසිම නායකයෙක් විවේචනය කළේ නැහැ. නමුත් මම එදා සම්බන්ධ වුණ ගුරු උද්ඝෝෂණය පිළිබඳව මගේ සහෝදර මන්ත්‍රීවරුන්ට යවලා, ඔවුන් මා සමග අමනාප කරවලා තියෙනවා. ගුරුවරුන්, විදුහල්පතිවරුන් 90%ක් වගේ ප්‍රමාණයක් මේ අසාධාරණය වෙනුවෙන් පෙනී සිටිනවා. ආණ්ඩුවේ නිලධාරීන් ගන්නා තීන්දු තීරණ නිසා මෙම ගැටලු මතු වෙනවා. ගුරුවරු සම්බන්ධයෙන් කතා කරනවා නම්, ඉගැන්වීමට පමණක් සීමා නොවී, පාසලේ සියලුම කාර්යයන් සඳහා දායකත්වයක් දරනවා. හැමදාම පාසල් පිරිසිදු කිරීමේ කටයුතු කරනවා. අපි නිල වශයෙන් මීට කලින් මන්ත්‍රීවරු කවදාවත් පාසල් සුද්ද කරන්න කැඳෙව්වෙ නැහැ. නමුත් ගුරුවරු විදියට අපි ඒ සියලු කටයුතු සිදුකරනවා. ගුරුවරු පිළිබඳව කතා කරන විට දැන් තත්ත්වය වෙලා තියෙන්නෙ. නයාට උඩුකොළ පේනවා වගේ.

ලෝකයේ සිටින ශ්‍රේෂ්ඨ ගෞරවනීය වෘත්තිය තමයි ගුරු වෘත්තිය. මෙම නිලධාරීන්ගේ අඩුපාඩු නිසා, විදුහල්පතිවරු, ගුරුවරු පැත්තකට දාලා පොලිසිය යොදවලා පාසල් විවෘත කරන්න කටයුතු යොදලා තියෙනවා. එයට මම කවදත් විරුද්ධයි. ඒ වගේම මෙම සටන වෙනුවෙන් පෙනී සිටින්නේ ජනතා විමුක්ති පෙරමුණේ ගුරුවරු, එක්සත් ජාතික පක්ෂයේ ගුරුවරු න්ගේ වැඩසටහනක් කියලා බොරු ප්‍රචාරයක් යවලා තියෙනවා. බලන්න ඒ ගුරුවරු කවුද කියලා. මෙම ගුරු ප්‍රශ්නය දිහා දේශපාලන කෝණයකින් බලන්න එපා. මධ්‍යස්ථව ඒ ගැටලුව දිහා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා. ගුරුවරුන් ගැන වැරදි අවබෝධයක් සමාජයට දෙන්න එපා. වර්තමානය වන විට ගුරුවරු, විදුහල්පතිවරු සමාජයේ අපහසුතාවයට පත් කරවනවා. ළමයින්ට අධ්‍යාපනය ලබා දීමේදී අපි ප්‍රායෝගිකව දන්නවා. පාසලේ සිටින, එහෙම නැත්නම් පන්තියේ සිටින සියළුම ළමුන්ට එක වගේ හැමෝටම හොඳ අධ්‍යාපනයක්, හොඳ සාරධර්ම දෙන්න බැහැ. අන්න ඒ වගේ හොඳ අධ්‍යාපනයක්, හොඳ විනයක්, හොඳ සංස්කෘතියක් ලබාගත්තේ නැති ළමයි තමයි. ලොකු වෙලා සමාජයට ගියහම, කොන්ද කෙලින් තියාගෙන වැඩ කරන්න බැරි වෙලා තියෙන්නෙ.

අපට දේශපාලනික වශයෙන් සිහින නැහැ. ඒ සිහින තියෙන අය අපි සමඟ ගැටලු ඇති කරගන්න එපා. මම මගේ වෘත්තිය වෙනුවෙන් යම් අසාධාරණයක් වෙනවා නම්, පක්ෂ දේශපාලනය පැත්තකින් තියලා, කටයුතු කරන්න සූදානම්. අවසාන වශයෙන් ගුරු සටනේ දී මම එදා වගේම හැමදාමත්, මතුවටත්, ගුරුවරු විදුහල්පතිවරු වෙනුවෙන් මේ සටනේ නියැළී ඉන්නවා. සහෝදර මන්ත්‍රීවරු කියනවනම් ඔබතුමා ලබන සභාවෙන් අයින් වෙන්න කියලා, මට ගැටළුවක් නැහැ. නමුත් මම එහෙම අයින් වෙන්නෙත් නැහැ. කරන්න පුළුවන් දෙයක් කරන්න. එහෙමනම් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් හා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් හා මාධ්‍යවේදී මහත්මයාගෙන් අවසරයි. මම මුලින්ම කියන්න කැමතියි. මාපලගම මහජන ක්‍රීඩාංගනයේ ඉදිවන ළමා උද්‍යානය සම්බන්ධව. මම දැක්කා පහුගිය දවස්වල පස් දාලා, මඩ ගොඩක එම උද්‍යාන භාණ්ඩ හිටවලා තියෙනවා. මම දන්නෙ නැහැ. මොන ආකාරයෙන් සකස් කරනවද කියලා. එහෙම ළමා උද්‍යානයක් හදනවා නම්, යම්කිසි ක්‍රමවේදයකට කරන්න ඕන. පස් ගොඩක, මඩ ගොඩක, ක්‍රීඩා භාණ්ඩ ටික හයිකරපු ආකාරය අනුව ජනතාව සෑහීමකට පත්වෙන්නේ නැහැ. සභාපතිතුමනි, යම් විදිහකට දරුවන්ට බැහැලා, මේ ක්‍රීඩා උපකරණ වලින් සෙල්ලම් කරන්න

වටපිටාවක් තියෙන්න ඕන. මම දන්නෙ නැහැ නිලධාරි මහත්වරු මේ පිළිබඳව අවධානය යොමු කරල ද, මේ ක්‍රීඩා භාණ්ඩ සිටුවීමට කටයුතු කළේ කියලා. මේ බිම් සැකැස්ම, මම හිතුවා හොඳට රෝලක් දාලා, පස් දාලා, කැටගල් අල්ලලා, එම ක්‍රීඩා භාණ්ඩ ටික සවි කරාවි කියලා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

මන්ත්‍රීතුමා දැන් ඔය පටන් ගත්ත විතරයි. වර්ෂාව නිසා තමයි ඔය විදිහට කරන්න යෝජනා වුණේ. නියමිත දිනට එම උපකරණ ගෙනැල්ලා සවි කරන්න ඕන. ඒ නිසයි එහෙම කළේ. නැතුව තවම වැඩ අවසන් කළේ නැහැ.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ඔබතුමාලා අර අලුත් උපකරණ මඩ ගොඩක සවිකරනවට වඩා එම උපකරණ කොහේ හරි දාලා තියලා, බිම සකසලා, ඉන් අනතුරුව සවි කරානම් හොඳයි කියලා මම කියන්නේ. මම දන්නෙ නැහැ ඔබතුමාලගේ ආණ්ඩුව වගේ තමයි කරන වැඩත්. වැඩක් කරනවා නම් එක හරියට කරන්න. දකින කෙනෙකුට වුණත් සතුටක් ඇතිවේවි. වැඩිපුර බිම් ප්‍රමාණයක් අරගෙන කළා නම්, හොඳයි. එම උපකරණ එක ගොඩේ සවි කරන්නේ නැතුව ළමයි 50ක් විතර එකවර ආවොත් කොහොමද සෙල්ලම් කරන්නේ.

ගරු සභාපතිතුමනි, අයහපත් කාලගුණ තත්ත්වයක් මේ වකවානුවේ තියෙන්නේ. මුලන වාඩියකන්ද මාර්ගයේ මාන පඳුරු දෙපැත්තෙම වැටිලා, යන්න බැරි වෙලා තියෙනවා. ඒ වගේම පාරේ යන්න අපහසු තරමට පාර අබලන් වෙලා. මල්වත්තහේන පාර, රක්ෂණ ගම්මාන පාර අබලන්. අපේ සභාවේ මාර්ග කම්කරුවන් කී දෙනෙක් ඉන්නවද කියලා, මුරකාරයෝ කී දෙනෙක් ඉන්නවද කියලා, සභා වාර්තාවෙ නම් මුරකරුවෝ11 ක් විතර ඉන්නවා. දැන් සභාවේ තියෙන තත්වය මේකයි. මොන මාර්ගයක යනවද කියලා දන්නෙ නැහැ.

පසුගිය සභාවෙදි එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කොටසක් ඔබතුමාගේ කතාව වෙලාවෙදි නැගිටලා ගියා. ඒ වෙලාවේ කිව්වා. එක මන්ත්‍රීවරයෙකුට දීමනා දීපු නිසා තමයි ඔය නැගිටලා ගියෙ කියලා. නැත්නම් ඔයගොල්ලෝ වාඩි වෙලා ඉන්නවා කියලා. අපි ඒ තරමටම බාල්දු වෙලා ඉන්නේ.

ඊළඟට මේ සභාවේ නිලධාරීන් දිගින් දිගටම වැඩ කරන්නේ නැහැ කියලා, සභා වාර දෙක තුනකදී ම කතා වෙනවා. මන්ත්‍රීවරයෙක් මට ඇහුනා කියනවා වැඩ කරන්නෙ නැත්නම් අයින් කරල දාන්න කියලා. මම දන්නෙ නැහැ. ඒ මන්ත්‍රීතුමාට ආණ්ඩුකාරතුමාගේ බලතල තියෙනවද කියලා. මොකද මන්ත්‍රීවරයෙකුට පුළුවන්ද සභාවෙ නිලධාරියෙක් අයින් කරන්න. ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මේ සභාවේ නිලධාරීන්ට වුණත් වැඩ කරන්න යම් රාමුවක් තියෙනවා. ඔබතුමාලා තව අවුරුදු තුන හතරකින් යාවි. මන්ත්‍රීවරුන් කියන විදිහට ඒ නිලධාරීන්ට වැඩ කරන්න බැහැ. වැඩ කරන්න යම් රාමුවක් තියෙනවා. රාජ්‍ය සේවකයෝ ඔය පොහොට්ටුව පත් කරන්න ඡන්දය දුන්නා. ඔවුන්ට චෝදනා කරනවා. පොහොට්ටුවේ ආණ්ඩුව, මහජනතාව පිළිබඳ කිසිම ඇගයීමක් නැහැ. මෙන්න තත්වය. මේ නිලධාරීන් කරන කැපකිරීම අපි දන්නවා. හැබැයි සමහර මන්ත්‍රීවරුන් හා සමහර උදවිය ඔවුන්ට කියලා වැඩ කරවගන්න බැරි වුනහම, මෙම නිලධාරීන්ට චෝදනා කරනවා. පසුගිය අපේ එක්සත් ජාතික පක්ෂ නායකතුමා දේශපාලන මැදිහත්වීම් නැතුව, අපේ නිලධාරීන්ට වැඩ කරන්න පුළුවන් වටපිටාවක් හදලා දුන්නා. ඒක තමයි කොමිෂන් සභා ඇති කරලා, රජයේ නිලධාරීන්ට ස්වාධීන වැඩ කරන්න අවශ්‍ය වටපිටාවක් හදලා දුන්නේ නැත්නම්, දේශපාලන හෙංචයියන්ට ඕන විදිහට තමයි රාජ්‍ය නිලධාරීන් වැඩ කරන්න ඕන. මම දිගින් දිගටම මේ පිළිබඳව මතක් කරන්නේ නැහැ.

අද මේ සෞභාග්‍යය දැක්ම අභාග්‍යයේ දැක්ම වෙලා තියෙනවා. මිනිස්සුන්ට පොහොර නැහැ. කන්න නැහැ.හැම පැත්තෙන්ම බඩු මිල වැඩි කරලා. ඇත්ත එළිවෙයි. අද එක්කෙනාට එක්කෙනා චෝදනා කරගන්නවා. ඒ වගේ ඔබතුමාලා වරදාන වරප්‍රසාද වලට යටවෙලා ඉන්න එපා. ගමේ මිනිස්සුන්ට කන්න බොන්න විදියක් නැහැ. මිනිස්සුන්ගේ ජීවන වියදම අහසට නැගලා. වගාවන් කරගන්න විදිහක් නැහැ. පොහොර නැහැ. හැමදේම එකකට එකක් වැඩියි. ජනතාව පිළිබඳ කිසිම තැකීමක් නැහැ. ඔබතුමාලගේ දැක්මවල් ක්‍රියාත්මක වෙයි.

තව එක කාරණයක් මතක් කරන්න ඕන. ඔබතුමා දිගින් දිගටම සංවර්ධන වැඩ පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරනවා. මේ බාල තුට්ටුදෙකේ සංවර්ධන වැඩ නතර කරලා, ජනතාව ජීවත් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි කාලය ඉක්මණින් ගෙවී ගිය නිසා ඉතා කෙටියෙන් කාරණා ඉදිරිපත් කරන්නම්. පළමුන්ම j.c.b. යන්ත්‍රය වෙන්දේසි කරනවට අපි විරුද්ධ නැහැ. නමුත් මෙම ක්‍රමවේදය තමයි  අපි ප්‍රතික්ෂේප කරන්නේ. කෙනෙක් හදිසියේම මළාම මරණ පරීක්ෂණයක් තියන්න ඕන. ඒ වගේම ක්‍රියාත්මක තත්වයේ තිබිලා, මේ මොහොත වනවිට නතර වෙලා තියෙන මෙම  යන්ත්‍රය අවුරුදු එකොළහක් එකතැන තියලා, වෙන්දේසි කරනවා කියන්නේ, ඒක හරියට මරණයක් භූමදාන කලා වගේ නෙවෙයි. ආදාහනය කළා වගේ. භූමදානය කලා ම පරීක්ෂණ වලට ගොඩ ගන්නවා. නමුත් ආදාහනය කළා ම පරීක්ෂණ නැතුවම වැලලිලා යනවා. එහි රියදුරුගෙන් කිසිම කෙනෙකුගෙන් කට උත්තරයක් නැතුව, අද අපි කතා කරගෙන යනවා. අවුරුදු එකොළහක් තිස්සේ මේ දේවල් කරන්න බැරි වුණා.ඒක නිසා හරියට පරීක්ෂණයක් කරලා තිබුන නම්, මේ වගේ කිසි කෙනෙකුට ගැටලුවක් මතුවෙන්නේ නැහැ. කැලි ගල ගැලවිලා පොලිස් පොත්වල නම් ලියවිලා, රාජකාරි කළා, කියලා තියෙනවා. කිසිම වාර්තාවක් නැහැ. මේක තමුන්නාන්සෙගෙ වරදක් නෙවෙයි. මේ සම්බන්ධව  කොමසාරිස්වරුන්ට දැනුම් දුන්නා. එතුමන්ලට මේක නිවැරදි කරන්න තිබුණා. නමුත් මේ මොහොත වන තෙක් එය නිවැරදි නොකළ නිසා තමයි අපි විරුද්ධත්වය ප්‍රකාශ කළේ. තමුන්නාන්සේලා තීන්දුවක් ගන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. කවදා හෝ මේ සභාවට එක්සත් ජාතික පක්ෂයෙන් සභාපති ධූරය දරන්න කෙනෙක් ආවොත්, මේ වාර්තාව පෙන්වන්න පුළුවන්. අපි නිකරුනේ අත ඉස්සුවේ නැහැ. මොකද මෙන්න මේ වැරැද්ද වෙලා තියෙනවා. දැන් වුනත් පරීක්ෂණයක් පවත්වන්න පුලුවන්. මොකද හිටපු සභාපතිවරු ඉන්නවා. උපසභාපතිවරු, මන්ත්‍රීවරු ඉන්නවා. කොන්දක් ඇතුව, කණ්ඩායමක් ලෙස, වැරදි දේට වැරදියි. හරි දේට හරි කියලා කියන්න පුළුවන්. මම ඒ ගැන වැඩිදුර කතා කරන්න යන්නේ නැහැ.

ඊළඟට ලැබීම් වාර්තාව බැලුවම මම දැනගන්න කැමතියි අලුත් වත්තෙ කොම්පෝස්ට් අංගනය කරගෙන යනවා. නව සේවකයෝ කී දෙනෙක් වැඩ කරනවද? මාසයකට ලැබෙන ආදායම කීයද? මේකෙන් අපට පාඩුද? ලාබද? කියලා තමුන්නාන්සේලා මෙතෙක් අපට වාර්තා කළේ නැහැ. අවුරුදු හතරක් වුණා. මේ දවස්වල තමුන්නාන්සේලාගේ ආණ්ඩුව රසායනික පොහොර නවත්තපු වෙලාවේ, කොම්පෝස්ට් වලට හොඳ ඉල්ලුමක් තියෙන වෙලාවේ, ආදායමක් ලැබෙනවා ද? අපට ලැබුණු ආදායම කීයද? ඒ සේවකයින් එතන මොකක්ද කරන්නේ. එතනින් සිදු වන කාර්යභාරය කුමක්ද කියලා කියන්න. ඊළඟ සභාව වෙනකම් මම ඔබතුමාලට කල් දෙනවා. ආදායම, වියදම, ලාභ, අලාභ විස්තර අපට දෙන්න. මේ නිලධාරි මහත්වරුන්ට හැකියාව තියෙන්න ඕන. ඊළඟ සභා වාරයෙදි මේ සම්බන්ධව වාර්තාවක් දෙන්න.

ඊළඟට මෙතන කතා වුණා. රුපියල් දෙදහස් ගාණක ගෙවීම සම්බන්ධව. ගණන නෙවෙයි. අපිට මෙතන තර්කය වුණේ, මන්ත්‍රීවරු විසි හත් දෙනෙක් ඉන්නවා. මේ ගැන ආණ්ඩුකාරතුමාට කියන්න. ව්‍යවස්ථාව කියවන්න කියලා මම අභියෝග කරනවා. සභාපතිතුමා ඉන්නවා, උප සභාපතිතුමා ඉන්නවා. ඊළඟට පේලියට ඉන්නේ මේ මන්ත්‍රී කණ්ඩායම. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ කියලා නැහැ. අපි මෙතනට පක්ෂ ලෙස තේරී පත් වුණාට පස්සේ තමයි. මේ විවිධ පක්ෂ නම්වලින් හඳුන්වන්නේ. ආණ්ඩුවේ ප්‍රධානියා ආණ්ඩුකාරවරයා. සභාපතිතුමාට ආරාධනා කරන කොට, උප සභාපතිතුමාට ආරාධනා කරන කොට ,සමස්ත මන්ත්‍රී මණ්ඩලයට ආරාධනා කරන්න ඕන. අපේ තර්කය ඒක. තමුන්නාන්සේලාගේ සුබසාධන කටයුත්තකට මෙතනට ඇවිල්ලා, කාල ගියත් අපි අනුමත කරනවා. ගරු මන්ත්‍රීවරුන් ඒක තමයි අපේ තිබෙන සුහදත්වය. නමුත් අපි හැල්ලු කරනවට කණ්ඩායමක් ලෙස අපි විරුද්ධයි.

සමහර ප්‍රශ්න ආවා. පියල් හිරිමුතුගොඩ මැතිතුමා, තමුන්නාන්සේට මතක ඇති. හොරණ ප්‍රදේශයේදී එන්නත්කරණයේදී යම්කිසි ක්‍රියාවක් සිද්ධ වුණා. අපට තිබුණා වීරයො වගේ කෑගහන්න. අත උස්සන්න. නමුත් අපි කණ්ඩායමක් ලෙස එකට හිට ගත්තා. ඒක තමයි හැඟීම කියන්නේ. කිසිම මන්ත්‍රීවරයෙක් හැල්ලු වෙන්න කැමති නැහැ.  අපේ හිටපු උප සභාපතිතුමා කියන ආකාරයට අපි මේසයක්  උඩ, පුටුවක් උඩ නැගලා, වතුර බෝතලයක් අරගෙන කෑ ගහලා නැහැ. අපි කතාවෙන්, ක්‍රියාවෙන් කිසිම අකටයුත්තක් කරලා නැහැ. අපි කණ්ඩායමක් ලෙස එකටයි යන්නේ.

මේ වගේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලෙ වගේ, නිලධාරින්, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලේ මේ වගේ කිසිම බලපෑමක් කරලා නැහැ. මම කුරුඳු වගාවට ඉල්ලුම්පත්‍රයක් ඉල්ලන්න ගියහම, එම නිලධාරියා කියනවා අදාළ මන්ත්‍රීවරයා, ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, නිර්දේශ කරලා නම් පමණයි ඒක දෙන්න පුළුවන් කියලා. සමෘද්ධි නිලධාරීන්, සංවර්ධන නිලධාරින්, සහ ග්‍රාම නිලධාරීන් තමයි ලැයිස්තු හදලා ඒ කටයුතු කළේ.

අපි ඒ වගේ කිසිම බලපෑමක් කරන්න ගියේ නැහැ. පූජ වට්ටියට අත ගහන්න වගේ ගියා මිසක්, කිසිම බලපෑමක් කලේ නැහැ. ගංවතුර ආධාර දීපු වෙලාවෙ, අපි කොහොමත් සර්ව සාධාරණව 100% ක් නොවෙයි. දේශපාලනය කරනකොට 100% ක් සාදාරණ වෙන්න බැහැ. ඒ පිළිබඳවත් ඔබතුමා දැනුවත් කරනවා.

අපේ පතිනායක මන්ත්‍රීතුමත් දන්නවා මේ කතාව. මේ මොහොත වන විට අධික වර්ෂාව නිසා නාය යෑම්, රතු නිවේදනයක් නිකුත් කරපු කොට්ඨාශයක් තමයි. නාගොඩ නෙළුව ප්‍රදේශය. මම දකිනවා. පහුගිය වකවානුව තුළ, කොතේගොඩකන්ද භූ විද්‍යා ආයතනයෙන් තහනම් කලාපයක් බවට පත් කරලා තිබෙන මොහොතක, ඒ කියන්නේ යන්ත්‍රෝපකරණ දාන්න බෑ කියලා යම් සිද්ධියක් වුණා. ඒකෙන් තහනම් කලා. අවදානම ඇවිල්ලා දින දෙක තුනක් ඒ පන්සලේ ජනතාව නවත්තලා හිටියෙ. මම දෙයක් සිද්ධ වෙන්න කලින් මේ කතා කරන්නේ. ඒ තහනම ඉවත් වෙලා ද කියන්න මම දන්නෙ නැහැ. තහනම ඉවත් වෙලා නැත්නම්, ඒ මරණ මංචකයේ, මේ මොහොත වන විට යන්ත්‍රෝපකරණ දාලා, පස් කැපීම සිද්ධ වෙනවා. හිටපු ප්‍රාදේශීය ලේකම්තුමිය මේක තහනම් කරලා තිබුණේ නම්? මේ තහනම එසේ ඉවත් වුනේ කවද්ද? ඒ අවසර ලබා දුන්නේ කෙසේ ද? ඒ කන්ද මේ පැත්තට ආවොත්, පලවෙනි පිම්ම මම. ඒ පාමුල තියෙන්නේ මගේ ඉඩම. අනෙක් පැත්තට ගියොත් අනිත් කඳු. වහින විට අපට මරණ බිය ඇති වෙනවා. ගෙවල් හදන්න අවශ්‍ය පස් කපනවට මම විරුද්ධ නැහැ. මම බලාගෙන ඉන්නවා මේ වර්ෂාවත් එක්ක ඇති.  මිනිස් ජීවිත දහස් ගණනක් බිලි ගන්න, එක දින ප්‍රමාදයයි වෙන්න ඕන. එක දිගටම පස් කපනවා. ගොරවද්දි, වහිද්දි එලෙසම කටයුතු සිදු වෙනවා. කන්ද යට පැලීමක් තියෙනවා. අවදානම් කියලා පන්සලේ නවත්තලා කන්න බොන්න දුන්නා.  මේ මොහොත වන විට ඒ ඉඩමේ වර්තමාන තත්ත්වය ඒකයි. ඒ නිසා ඉතාමත් කාරුණිකව ඉල්ලන්නේ, හෙට දවසේ මම නැති වුණත් කියන්නේ, මේ සභාවේ අර මන්ත්‍රීතුමා මේ ගැන කතා

වෙලා තියෙනවා කියලාවත්, මට ඉතිහාසගත වෙන්න පුළුවන්. එපමනයි මට කියන්න තියෙන්නෙ. ගම්වැසියෙක් හැටියට ඔබතුමා මේ වෙලාවේ තමුන්නාන්සේලා වචනෙකින් හරි මාත් සමග එකට ඉඳීම සම්බන්ධයෙන් මම ගෞරවය පුද කරනවා.

ඊළඟට තමුන්නාන්සේලා සියලු දෙනා විසබීජහරණය පිළිබඳව කතා කළා. මම නම් දැක්කේ නැහැ. කොහෙවත් විසබීජහරණය කරයි කියලා. අපේ පළාත් වල නම් මේ දේ සිද්ද වුනේ නැහැ. ඔබතුමාලගේ පළාත් වල සිදුවුනාද කියලා මම දන්නේ නැහැ. මන්ත්‍රීවරුනි ඔබතුමා වනිගරත්න කියන චරිතයට නෙවෙයි අපි එදා කතා කරේ. අම්මා, තාත්තා, ඇරුනම, අපේ භක්තිය තියෙන්නෙ ගුරුවරුන්ට. ඔවුන් නිසයි අපට මෙසේ මෙතන හිටගෙන කතා කරන්න පුළුවන් වෙලා තියෙන්නෙ. මාවනැල්ලෙදී උප සභාපතිවරයෙක් හා මන්ත්‍රී කණ්ඩායමක් අපි වේදනාවෙන් බලාගෙන හිටියා. විදුහල්පතිවරු ඇතුළු කණ්ඩායමකට පහර දෙන්න. එවැනි ම්ලේච්ඡ ක්‍රියා අපි හෙළා දකිනවා. ඒ පිළිබඳව මම වැඩිය කතා කරන්නේ නැහැ. නමුත් මේ ගුරු භක්තිය, කොහෙවත් නැති හාල්පාරුවන්ට වාහන 225ක් ගෙන්නන්න, ආණ්ඩුවට සල්ලි තිබුණා. නමුත් ගුරුවරයාගේ සොච්චම ගෙවන්න ආණ්ඩුවට සල්ලි නැහැ. ඔන්න ඕක තමයි අපි විරුද්ධ.

අවසාන වශයෙන් අපි තමයි ඔක්කොම කලේ කිව්වත්, මිනිස්සුන්ට ජීවත් වෙන්න බැරිව, ජීවන බර අහස උසට නැගල තියෙන්නේ. ගමට ගියහම, අහිංසක කුලී කරුවන් ට ජීවත්වෙන්න බැරි වෙලා තියෙනවා. ගෑස් නැහැ. කිරිපිටි නැහැ උද්ධමනය අහස උසට නැඟලා. තමුන්නාන්සේලා කොන්ක්‍රීට් දාන්න කතා කරනවා. කොන්ක්‍රීට් දාලා, යන්නත් මිනිස්සු ඉන්නවද කියන එකයි ගැටලුව. බයිසිකලයට ටයර් එකක් නැහැ. ගේන්වල දළු නැහැ. පාසල් දරුවන්ට ඇඳුමක් ගන්න මුදල් නැහැ. අද ඇඹු කඳුළින් අහිංසක අම්මලා, තාත්තලා ජීවත් වෙන්නේ. පාරවල් ආදාහනාගාර හැදුවත්, පුච්චන්න දෙයක් නැහැ. පිච්චිලා ඉන්නේ. තමුන්නාන්සේට මම කියනවා අසාර්ථක වූ ආණ්ඩුව, අසාර්ථක ගමනක් යන මොහොතක, වා වැරදිලාවත් ගංවතුරක් එන්න එපා කියලා ප්‍රාර්ථනා කරමින්, තමුන්නාන්සේලාට ජයග්‍රාහී හෙට දවසක් උදාවේවායි ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා**

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම අපේ j.c.b. එකේ කොටස් ඌරල ෂෙඩ් එකෙන් මතු වෙන්න පුළුවන් කියලා මම ප්‍රකාශ කරනවා. ඒ ගැන වැඩිය කතා කරන්නේ නැහැ. මම 1 වසරේ සිට ක්‍රිස්තුදේව පිරිමි විද්‍යාලයේ අවුරුදු දහතුනක් අධ්‍යාපනය ලැබුවා. ශිෂ්‍යත්වය සමත් වුණා. නමුත් කිසිම ටියුෂන් එකකට ගියෙ නැහැ. එදා ඒ ගුරුවරු පාරට බැස්සෙ නැහැ. අපිව ප්‍රාණ ඇපයට තියා ගත්තෙ නැහැ. අවුරුදු විසි හතරක් තිබුන ප්‍රශ්න වලට, මේ වගේ ඉතා අමාරු කාලයක විසඳුම් හොයන්න ගිහිල්ල වර්ජනය කළේ නැහැ. ඒ ගුරුවරුන්ට මම අදටත් හිස නමා ආචාර කරනවා.

අද ගුරු විදුහල්පති සම්බන්ධයෙන් වැටුප් ප්‍රශ්නයක් තියෙනවා. ළමුන්ගෙ දෙමව්පියන් පාසලට කැඳවලා අනිවාර්යෙන් උද්ඝෝෂණ වලට සහභාගී වෙන්න කියලා බලකරනවා. එවැනි පහත් තැනකට මේ ගුරුවරු විදුහල්පතිවරු පත්වෙලා තියෙනවා. මෙය දේශපාලන උවමනාවකට සිදු වන දෙයක්. මොකද ඔවුන් ගුරුවරු ගැන කිඹුල් කඳුළු හෙළනවා. ඔවුන්ගේ කාලවකවානුව තුළ ඔවුන් මොනවද ගුරුවරුන් වෙනුවෙන් සිදු කළේ. නමුත් ගුරුවරු දැන් ඒ උගුලට අහු වෙලා ඉවරයි. වර්තමානය වන විට අපේ රට ඉතා දැඩි ලෙස ආර්ථික වශයෙන් දැඩි ප්‍රපාතයකට පත්වෙලා තියෙනවා. මොකද රට පත්වුණ කොවිඩ් වසංගත තත්ත්වයත් සමග දහ පාරකට ආසන්න ප්‍රමාණයක් රට වැහුවා. ආදායමක් එන්න විදියක් නැහැ. ඒ වගේම කොවිඩ් වසංගත තත්ත්වය මර්දනය කිරීම සඳහා එන්නත්කරනය කරලා, මරණ සංඛ්‍යාව අඩු කරල තියෙනවා. ලෝකයේ අනෙක් රටවල් හා

සාපේක්ෂව බලන විට අපේ රට ඉතා උසස් තැනකට ගේන්න අපේ පාලකයෝ ක්‍රියාකරලා තියෙනවා. මොකද මේ කොවිඩ් වසංගතය කියන්නේ මුළු ලෝකෙටම බලපාපු ඉතා දැඩි ප්‍රශ්නයක්. 2005 වර්ෂයේදී ආණ්ඩුව ගනිද්දී කිව්වේ, මහින්දට කරන්න බැහැ කියලා. ඒත් බැහැ කිව්වද? නැහැ. කරනවා. අවුරුදු තුනක් යනකොට රට නිවැරදි මාවතකට ගන්නවා. යම් යම් අඩුපාඩු තියෙනවා. ඒක ඇත්ත. මොකද ලෝක වෙළෙඳ පොළේ ගෑස් මිල, තෙල් මිල වැඩි වුණා. පහුගිය කාලේ අපට බාර දුන්නේ ආර්ථිකය නගගල තිබුණු ආණ්ඩුවක් නෙවෙයි. විනාශ කරපු ආර්ථිකයත් තමයි අපට බාර දුන්නේ. අපිත් කට වහගෙන ඉන්නව නම් හැමෝම කැමති වේවි. ඕනෙම චෝදනාවකට උත්තර දෙන්න සූදානම්. සංවර්ධනය ගැන කතා කරද්දි, කිලෝමීටර් 100000 වැඩසටහන, මේ වගේම රැකියා ලක්ෂය දිලා ඉවරයි. පොහොර සම්බන්ධයෙන් කතා කරනවනම්, කෘෂි කර්මාන්තයට රසායනික පොහොර නෙවෙයි කාබනික පොහොර ලබා දෙනවා. ඒ මොනවත් නිසා නෙවෙයි. රටේ මිනිස්සුන්ට පවත්නා ආදරේ නිසා. අපි මේ අවුරුද්දේ කාබනික පොහොර වලින් කටයුතු කරලා බලමු. අවසාන වශයෙන් මගේ කොට්ටාශයේ යෝජනා සම්බන්ධයෙන් අදාළ කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අපේ සහෝදර මන්ත්‍රීතුමා ඉන්නවා කොහොමහරි කැගහලා කාපට් ටික විවේචනය කලා ගිය සභාවේ දී ඇත්තටම ලැජ්ජයි මන්ත්‍රී තුමනි, ඔබ ඔහොම කතා කරන්න එපා, මේ ගමේ සංවර්ධනය දැක්කම, පහුගිය දවස් වල මම ගමේ සහෝදර ජනතාවට, විපුලසාර සංස්කෘතික මධ්‍යස්ථානයේදී ලක්ෂ දාසයක බඩු බෙදුවා. වසන්ත මන්ත්‍රීතුමා කිව්වා අභාග්‍ය ගම්මානය කියලා. හැබැයි ඔබතුමා සතුටු වන්න. ලක්ෂ දාසයක බඩු මේ වන විට බෙදලා ඉවරයි. රසකැවිලි ගම්මානයක්. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඒ අලෙවියක් සිදු කරා. ඔබතුමා සතුටු වෙන්න. ඔබේ ගමේ ඥාතීන් ඉන්නවා. මම ඔබතුමා වගේ පක්ෂග්‍රාහීව කටයුතු කළේ නැහැ. මම මගේ ගමේ ජනතාව තෝරා ගැනීමක් කරේ නැහැ. හැබැයි ඒකට දක්ෂතාවය තියෙන, දුප්පත් අය තමයි තෝරා ගත්තේ. ඔබතුමාට මේවා දකින කොට කැක්කුමක් ඇති. ඒ වගේම මේ වන විට කෝටි දෙකේ පාරවල් පාස් වෙලා තියෙනවා. පහුගිය දවස් වල මැනුම් කටයුතු කරලා, ඇස්තමේන්තු හදලා තියෙන්නේ. ප්‍රශ්න තියෙනවා. සිමෙන්ති නැහැ. රජයට දැන් කිසිම ආදායමක් නැහැ. හැබැයි රාජ්‍ය සේවකයන්ගේ පඩි නවත්තලා නැහැ. දෙන්න පුළුවන් සියලුම දීමනා දීලා, කරගෙන යනවා. කොවිඩ් වසංගතය අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එහෙම දෙයක් තිබුණෙ නැහැ. හැබැයි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොහොර පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීමේදී, ඒ ගත්තු තීන්දු තීරණ කොවිඩ් වසංගතයක් එක්ක පොඩි අර්බුදයක් බවට පත් වෙලා තියෙනවා. පොහොර පිළිබඳ ගැටලුවක් අපටත් තියෙනවා. නිවැරදි කරලා අවශ්‍ය දැනුම අරගෙන, කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා ඔබතුමාලා පොඩ්ඩක් ඉවසලා ඉන්න. අපි ඒ වැඩ ටික කරලා දෙනවා. මේ ප්‍රශ්න නැත්නම් මේ වන විට මාර්ග කටයුතු වැඩ අවසන්. ඔබතුමා අවුරුදු ගණනක් සභාවෙ හිටියා. ඒත් කිසිම දෙයක් කරගන්න බැරි වුණා. ඒ පිළිබඳව අපි කණගාටු වෙනවා. මම මන්ත්‍රී වෙලා තවම අවුරුදු තුනක කාලයක් වෙන්නෙ. ඒ කාලය තුල ගමේ අස්සක් මුල්ලක් නැර, සෑම මාර්ගයක්ම මැනුම් කටයුතු කරලා, සියලු වැඩ කටයුතු අවසන් කරලා තියෙන්නේ. ඒ නිසා ඒවා ඉදිරියේදී සංවර්ධනය වෙයි කියලා මම හිතනවා. තව අවුරුදු තුනකින් එහෙම නොවුණොත්, ඔන්න ඔබට පුළුවන් ඔය චෝදනා නගන්න කියලා සඳහන් කරමින්, මම වැඩිදුර කතා කරන්නේ නැහැ. විශේෂ කථාවාරයේදී මම සභාපතිතුමාගෙන් ඉල්ලන්නේ, ඕනම සභාවක කතා කිරීමට යම් නිශ්චිත කාලයක් වෙන් කරල තියෙනවා. ඒ කාලය කළමනාකරණය කරගන්න. මොකද දෙන්නෙක් පැය ගණන් කතා කරද්දි, අනෙක් මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වෙනවා. මේ වගේ බොරු නිස්කාරනේ, කතා වලට කාලය අපතේ යවන්න එපා. සභාපතිතුමනි, මන්ත්‍රීවරයෙක් කොතරම් විවේචන කලත්, පිළිතුරු දෙන්න, තමන්ගේ අවස්ථා වෙනතුරු ඉන්න.

මේක ගෞරවනීය සභාවක් ලෙස මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් කතා කළා. ඇත්තටම මම ඒ සම්බන්ධව සතුටු වෙනවා. අවුරුදු තුනක් සභාව ගෙනියන්න කටයුතු කළා. අපි සභාවක් හැටියට, ඒ වගේම මේ ගමන් මග ඉදිරියට ගෙනියන්න, පසුපෙල මන්ත්‍රීවරුන් හැටියට, උපරිම සහයෝගය ලබාදී, ගමට යහපතක් කිරීමට කැපවන බවත්, මතක් කරමින්, සාර්ථක ඉදිරි ගමනක් යාමට ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, අපේ වනිගරත්න මන්ත්‍රීතුමා මේ ගුරු ප්‍රශ්නය සම්බන්ධව මට විශාල වශයෙන් චෝදනා ඉදිරිපත් කලා. ගුරුවරු සම්බන්ධයෙන් වෛරයකින් ඉන්නවා කියලා. මමත් මගේ ගුරුවරුන්ට ගෞරව කරනවා. මේ සභාවේ මන්ත්‍රීවරයෙක් විදිහට මෙහෙම කතා කරන්න, එහෙම නැත්නම් මාව කථිකයෙක් කරන්න, අපේ මාධ්‍යවේදී හේමපාල මහත්මා, වීරසිංහ විදුහල්පතිතුමත් තමයි මට උදව් කලේ. මං ඒ සම්බන්ධයෙන් එතුමන්ලාට ගරු දෙව්වරු ලෙස අදටත් ගෞරව කරනවා. නමුත් චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා මන්ත්‍රීවරයෙක්. කණ්ඩායමක්, පක්ෂයක් හැටියට එතුමාට ඉන්න තැන අමතක වීම පිළිබඳවයි මම කනගාටුවෙන් කතා කළේ. මම ඊට එහා දෙයක් කිව්වේ නැහැ. මන්ත්‍රීවරයෙක් ලෙස අපි ජනතාව වෙනුවෙන් පෙනී සිටිනවා. එතුමා කතාවේදී මගේ නම සම්බන්ධ කළා. ඊට විරුද්ධව කතා කළා කියලා ප්‍රකාශ කළා. එතුමගේ කතාවේ සඳහන් කල මගේ නම අයින් කරන්න කියලා ඉල්ලා සිටිනවා. මම දැඩි විරෝධයක් කවදාවත් කරලා නැහැ. මම මේ සිද්ධිය ලේසියෙන් අත්හරින්නේ නැහැ. මම පුලුවන්නම් ලබන සභාවේ විනය ක්‍රියාමාර්ගයක් ගන්නවා, විශ්වාසභංගයක් ගේනවා. ඒ පිළිබඳව දැඩි කනගාටුව ප්‍රකාශ කරනවා. අජිත් එඬේරආරච්චි මහතා ඕන කෙනෙකුට තේරුම් ගන්න පුලුවන් ආකාරයෙන් හොඳ පැහැදිලි කිරීමක් කළා.

මොන ප්‍රශ්න තිබුනත්, අපි කණ්ඩායමක් ලෙස හොඳ ගමනක් යන්න ඕන. නැත්නම් ඒ ගමන සාර්ථක නැහැ. අද අපට එල්ල වුන ප්‍රශ්න රාශියක් තියෙනවා. අපි සිංහල ජාතියක් ලෙස කනගාටුවට පත් වෙන්න ඕන. මොකද උතුරු-නැගෙනහිර පාසල් ළමුන්ගේ වැඩ කරන අතරතුරමයි විරෝධතා කරන්නේ. ඒ පාසල් වැඩ අතපසු වෙන්නෙ නැහැ. එමෙන්ම ගොවිතැන් කටයුතුත් තියෙන පහසුකම්වලින් කරගෙන යන අතරතුර තමයි විරෝධතා කරන්නෙ. නමුත් දකුණේ එහෙම නැහැ. ළමුන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් කරලා තමයි. මෙම විරෝධතා සිදු කරන්නේ. ගරු රිචර්ඩ් පතිරණ මැතිතුමා තමයි මෙම ගුරු වැටුප් විෂමතාවය නැති කරන්න කටයුතු කළේ.

අද ලෝකය කොරෝනා වෙලා ගත්ත වෙලාවක, ආදායම ඉතාමත් අඩු මට්ටමක තමයි තියෙන්නේ. එවැනි තත්වයක් තුළ රාජ්‍ය සේවකයන්ගෙ වැටුප් කැපුවෙ නැහැ. මිනිසුන්ට ලබා දෙනු ලබන ආධාර, සමෘද්ධිය කැපුවෙ නැහැ. ඒ සියලු වරප්‍රසාද ඒ විදිහටම ලබා දුන්නා. වෙන රටවල් වල පඩියෙන් බාගයයි ලබා දුන්නේ. ප්‍රාතිහාර්යය පාන්න පුළුවන් කෙනෙක් හිටියත් මේ දේ කරන්න බැහැ. අපි විදේශ රටවල් වලින් කාලා බීලා ඉන්න තත්වයකට පත් වෙලා තියෙනවා. මේ දේවල් හමුවේ කවුරු රට පාලනය කළත්, මේ දේ කරන්න බැහැ. කවුරු මොනවා කිව්වත්, අපි එකට නැගී සිටියේ නැත්නම්, කරන්න බැහැ. රසායනික පොහොර ලබා දෙන්න උත්සාහ ගන්නවා. අවශ්‍ය අයට කාබනික පොහොර ගන්නත් සලසනවා. අද අපේ ආණ්ඩුව ගෙදර ගිහිල්ලා, වෙන කෙනෙක් ආවත්, මේ විදියටම තමයි  කරන්න වෙන්නේ. එහෙමනම් මම මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වුනෙ නැහැ. අපේ විදුහල්පතිතුමා කල ප්‍රකාශය නිසා තමයි මෙතරම් කතා කළේ. මම නැවත වතාවක් එතුමාගෙන් ඉල්ලා සිටින්නෙ, ගුරු විදුහල්පති සම්බන්ධ කතාවේදී අභූත චෝදනාවක් ඉදිරිපත් කරමින් මගේ නම සම්බන්ධ කරමින් සිදු කල ප්‍රකාශයෙන් මාගේ නම ඉවත් කර දෙන මෙන් ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා.   බොහෝම ස්තුතියි

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

අපේ ධනංජය මන්ත්‍රීතුමා සහ ලක්රුවන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි අපේ ගම් වල මිනිස්සු හරිම සන්තෝෂයෙන් තමයි ඉන්නේ. කිසි ප්‍රශ්නයක් නෑ වගේ. ලක්රුවන් මන්ත්‍රීතුමා සමාවෙන්න. ඔබ සභාව පාලනය කරන්න යනකොට අපේ අතපය විසි කරලා කතා වෙනවා. සමාවෙන්න මොනවහරි අපහසුතාවයකට පත්වුණා නම්. මොකද ඔබට බැහැ මේ මන්ත්‍රීවරුන්ට වාඩි වෙන්න කියන්න. කතා කරන්න එපා. කතා කරන්න කියන්න නියෝග දෙන්න ඔබට බැහැ. සභාවේ ඕනම කෙනෙකුට අයිතියක්, හැකියාවක් තියෙනවා කතා කරන්නත්, විවේචන දරාගන්නත්. ඒ විවේචන දරාගන්න බැරි නම්, නිවැරදි කරන්න මේකට උත්තර දෙන්න හයියක් නැත්නම්, මේ සභාවට නැවිල්ලා ඉන්න එක හොඳයි. ගරු උප සභාපතිතුමනි අපේ විජිත් සහබන්දු මන්ත්‍රීතුමන්ලා මහන්සි වෙලා, මාමනදොළ පාර හදලා තියෙනවා. වතු සමාගම් වලින්, තේ වතුවලින් හේදිලා එන ජලය පාරට තමයි එන්නේ. පෞද්ගලික ගෙවල්වල වතුරත් එනවා. ඒව ඉතින් අපේ හිතවත්කම් මත, අල්ලපු ගෙවල් වල මිනිස්සු වත් කියන්නේ නැහැ හිතවත්කම නිසා. නමුත් කෝටි ගානක් වියදම් කරලා හදපු පාරවල් නඩත්තු කරන්න අපට අපේ කියන තියෙන සම්පත් ටික මදි. නමුත් මේවට නීතිමය මට්ටමෙන් ගන්න එක ක්‍රමයක් තියෙනවා. කුඹුරුහේන පාර ගත්තොත් එම පාරේ යන්න බැහැ. වතුර එන්නෙ සියල්ලම පාර පැත්තට. ඒ වගේම මාමනදොල පාරේ හැම පැත්තෙන්ම වතුර පාරවල් ඇවිල්ලා, පාරෙ සමහර තැන් වල තාර නැහැ. මඩ පාරවල් තියෙන්නේ. ඒ නිසා වතු සමාගම් වලට කතා කරලා, මැෂින් දාලා, කානු කපලා, අදාල වතුර පාරවල් ටික සමථයකට පත් කරන්න කියලා මම ඉල්ලනවා.

අපේ මන්ත්‍රීවරු ජාතික ප්‍රශ්න ගැන කතා කලා. මේ ජාතික ප්‍රශ්න වගේම ඔබට පේන්නේ නැද්ද අපේ ගම් වල කඩ තනිකර කළු කඩ බවට පත් වෙලා. සිමෙන්ති කොට්ටයක් 1200.00 යි කියලා ගහලා තිබ්බට, රුපියල් 1800.00, 1600.00 වැනි මිලකට විකුනන්නෙ. නමුත් අපි කවුරුවත් මේවා කතා කරන්නේ නැහැ. නමුත් කවුරු හරි මේවා අල්ලන්න ඕන. අඩුම ගානෙ පාරිභෝගික අධිකාරියෙන් හරි, 1988- 1989 කාලේ වත් වැනි කළු කඩ ක්‍රමයක් නිර්මාණය වෙලා තිබුනෙ නැහැ. අද ඔබ ටවුමට ගිහිල්ලා බලන්න. දරුවෙකුට ගාල්ලේ පාසලට යාමට එක දවසට විතරක් රුපියල් 400.00 ක් වාහනයට ඉල්ලනවා. ඇත්තටම දෙමව්පියන් මේ බර දරා ගන්නෙ කොහොමද? මේ අපේ කතා කරන මන්ත්‍රීවරුන් හිතුවට සමාජයේ ලොකු ප්‍රශ්නයක් නෑ කියලා, ගම ඇතුලේ මොන තරම් බරපතළ ප්‍රශ්න තියෙනවද? මනුස්සයකුට ලෙඩකට බෙහෙතක් ගන්න බැරි, ත්‍රීවීල් එකකට සල්ලි දෙන්න බැරි, ජීවත්වෙන්න බැරි තරම් බරපතළ කාරණා ගම් වල තියෙනවා. අපි මේ රුපියල් දෙදාහකට විරුද්ධ වුණේ නැහැ. නමුත් මේ කරපු ක්‍රමයටයි අපි විරුද්ධ වුණේ. උප සභාපතිතුමා කිව්වා වගේ ආණ්ඩුකාරතුමා එහෙම කිව්වනම්, අපි එතුමාටත් විරුද්ධ වෙනවා. අපි එක කණ්ඩායමක් ලෙස හිටිද්දී මෙහෙම කළාම, මන්ත්‍රීවරුන් අතර බෙදීමක්, මන්ත්‍රීවරුන් අතර ගැටුමක් ඇතිවෙනවා. ගමේ ඔබට ඡන්දෙ දීපු මිනිස්සුන්ගේ ගෙවල්වලට ගිහිල්ලා, ඔවුන් විඳවන විදිහ බලන්න. නැවත වතාවක් මම ඔබතුමාට කියන්නේ, ඔබේ මන්ත්‍රීවරුන්ට විතරක් දේවල් දෙන්න එපා. ඔබතුමා තරම් මේ කැත වැඩේ කිසිම මන්ත්‍රීවරයෙක් කළේ නැහැ. මේ ගත්ත යෝජනා, මේ ගත්ත විදිය දැක්කම, වෙන කිසිම මන්ත්‍රීවරයෙක් මෙවැනි කැත තීරණ ගත්තේ නැහැ. මේ මන්ත්‍රීවරුන්ට කරන්නේ බරපතළ අසාධාරණයක්. මම වැඩිය කතා කරන්නේ නැහැ. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමාගෙන් හා මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මුලින්ම අපේ නිශාන්ත මන්ත්‍රීතුමාට අමතක වුණු කාරණයක් සම්බන්ධයෙන් කතා කරන්න මම කැමැතියි. අපේ නිශාන්ත මන්ත්‍රීතුමා, ප්‍රදේශයේ හිටපු දක්ෂ ක්‍රීඩකයෙක්. ඔහු තරම් වොලිබෝල් සම්බන්ධ ක්‍රීඩකයෙක් මෑතකදී බිහි වුණාද යන්න  අපි දකින්නේ නැහැ. දැන් ක්‍රීඩාව අභාවයට ගිහිල්ලා තියෙන්නෙ. හැමදේම. යටලමත්තේ ඉදිකරන වොලිබෝල් පිට්ටනිය හා එම ස්ථානය සම්බන්ධයෙන් සැළකිල්ලක් දැක්වුවානම්, ඔය කියන බිම් ප්‍රමාණයෙන් වොලිබෝල් ක්‍රීඩාංගනයක් හදන්න පුළුවන්ද කියලා ප්‍රශ්ණයක් ගොඩනැගෙනවා. අඩි 40ක් විතර කණ්ඩියක් තමයි ඉතුරු වෙන්නේ. ඒ ඉතුරු වෙනකොට ඒ පස් ප්‍රමානය කොහොමත් එතන දාන්න බැහැ.  වොලිබෝල් පොයින්ට් එක නීත්‍යානුකූලව දිග පළල 60යි. 30යි. දෙපැත්තෙම තව 10 - 10 වොලිබෝල් කෝඩ් එකේ දෙපැත්ත තියෙන්න ඕන. ඒ තියෙන ප්‍රමාණය ප්‍රමාණවත් ද කියන එක අපට ප්‍රශ්නයක්. ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන්න ඕන. ඒ වගේම කවුරුහරි දන්න කෙනෙක් පත් කරලා, ලොකු වැඩසටහනක් ලෙස, වොලිබෝල් කෝඩ් එක හදන්න ඕන. නැත්නම්, ගෙපල් කාරයන්ට පස් දීලා, ලොරි කාරයන්ට විකුණලා, එහෙම නේද දැන් කරන්න හැදුවේ. එහෙම යන්න එපා. සභාවටනෙ දැන් දීලා තියෙන්නේ. සභාවෙන් පස් ටික එතන දාන්න බැරිනම්, කොහේ හරි ගෙනිහින් දා ගන්න. j.c.b. අයට හා ලොරි කාරයන්ට අපේ ඉඩමක පස් ඇදගන්න දෙන්න පුලුවන්ද? මම හිතන විදිහට ඒක නවත්තපු එකත් හොඳයි. ඒ පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. නිශාන්ත මන්ත්‍රීතුමා මා දැනුවත් කරලා ගියේ. ඒ පිළිබඳ ඉතා විශාල දැනුමක් තියෙන කෙනෙක් වශයෙන්, සභාව දැනුවත් කරන්න කියලා.

ඊළඟට මාමනදොළ පාර 5km ගානක් කෝටි 6 කුත් ගානක පාරක් දැන් සකස් කරලා, විවෘත කරන්න තියෙන්නේ. ඒක විවෘත කරත්, නොකරත් එතුමා අද නෙවෙයි මීට කලින් අපිත් මේ සභාවේ මතක් කරලා තිබුණා. මේ පාර නඩත්තු කරගන්න බැරුව, ඉතා දුර්වල  තත්ත්වයේ තියෙන්නෙ. හේතුව ඒ අතුරු මාර්ග වලින් එන පස්, සෝදා පාළු වීම නිසා, ඒ ඔක්කොම කාපට් පාරට තමයි එන්නේ. ඉතින් පස් තට්ටුවක් දැනටම පිරිලා. අතුරු මාර්ග වලින් වතුර බැස යාම නිසා, ප්‍රධාන පාරට තමයි පිවිසෙන්නේ. ඒ නිසා අතුරු මාර්ග වලින් ප්‍රධාන පාරට පස් සෝදා ගෙන ඒම වැළැක්වීම සඳහා ගරු සභාව විසින් වත්ත දැනුවත් කරලා, නීත්‍යානුකූලව ලිපියක් යවන්න. අපේ මන්ත්‍රීතුමිය කිව්ව වගේ, මේ කටයුත්ත කරන්න. කෙතරම් හොඳට පාරවල් හැදුවත් වටවල වැව්ලි සමාගමට අයත් වතු යටලමත්තෙන් පටන් ගත්තම මාමනදොළට  යනකම්ම කටු පොල් ගස් තියෙන්නෙ. මේ කටු පොල් ගස්වල පිති පාරට නැවිලා තියෙන්නේ. එම ගස්වල අතුරිකිලි ඉවත් කරන්න කියලා ලිඛිතව දැනුම්දීමක් කරන ලෙස මා මේ අවස්ථාවේ දී ඉල්ලා සිටිනවා.

ඊළඟට පාසල් පටන් ගැනීම පිළිබඳ යම් යම් කරුණු තිබුණා. ඔබතුමාල දකින න්‍යාය සහ ඔබතුමාලා දකින කෝණයෙන් නෙවෙයි අපි දකින්නේ. එකේ යම්කිසි දේශපාලන අරමුණක් තිබුණා. 100% ක් දේශපාලන අරමුණක් ක්‍රියාත්මක වුනේ. උද්ඝෝෂණයක් වුනත්, අපි ඒවා දකින්න, බලන්න, විඳින්න කැමතියි. ගුරුවරුන්ට, විදුහල්පතිවරුන්ට පඩි වැඩි කරයි කියලා බලාපොරොත්තු වුණා. අපේ ඉල්ලීමත් ඒකයි. අපි අකුල් හෙළනවා නෙවෙයි. හැබැයි දේශපාලන කෝණයෙන් මේ වැඩ කරනකොට අපටත් දේශපාලන කෝණයෙන් මේවා බලන්න ඕන.

ආරම්භයේදී කොවිඩ් වසංගතය නතර වී ඇති ප්‍රදේශවල ළමයි දෙසීයට අඩු පාසල් ආරම්භ කරන්න, ළමයින්ට අවශ්‍ය නම් මාස්ක් අරන් දෙන්න. ඒ වගේම පිරිසිදු කරන දියර ලබා දෙන්න. අත සෝදන ස්ථාන ඇති කරන්න. කොරෝනා වලින් වැලකෙන්න අවශ්‍ය දැනුවත් කිරීම් සඳහා පාසල් වල පුවරු ගසන්න, මේ වැඩපිළිවෙළවල් තමයි ක්‍රියාත්මක වුනේ. ළමයි 200 ට අඩු පාසල්වල අපේ මන්ත්‍රීතුමාලා කැඳවලා මේ පිළිබඳව සාකච්ඡා කළා. ඒ අවස්ථාවේදී තේ සඳහා ගිය වියදමක් සඳහා තමයි අපට මේ බිලක් දාන්න සිදුවුණේ. අපට කණගාටුයි සභාවක තේ බීලා මෙහෙම දෙයක් සිදු

වුනාම. පහුගිය ආදාහනාගාරය විවෘත කිරීමේ උත්සවය සඳහා මේ ස්ථානයේ තේ මේසයක් සකස් කරලා තිබුණා. රුපියල් තිස් හතළිස් දාහක් වියදම් කරලා. මම හිතන්නේ මන්ත්‍රීවරුන් සියලු දෙනාට ආරාධනා කළා. නමුත් ආවෙ කවුද? මම දැක්කා වනමල් මන්ත්‍රීතුමා විතරයි පැමිණ සිටියේ. ඒ ගිය වියදම් එක්ක බැලුවම මෙම ගෙවීම මොකක්ද කියලා හිතෙනවා. ඒ වගේම දිවා භෝජන සංග්‍රහයක් ලෑස්ති කරල තිබුණා. ආණ්ඩුකාරතුමා ඇතුළු වැදගත් පුද්ගලයින් හා සමඟ ඇමතිවරු, මන්ත්‍රීවරුන් සම්බන්ධ වුණා. මන්ත්‍රීවරුන් සියලු දෙනාට අපි ඕඩර් එක දුන්නා. නමුත් කීදෙනාද ආවේ. බැලුවම රුපියල් 5000.00 ක විතර මුදලකටත් බෙදීමක් ඇති වුණා. ඒ දවස් වල මේ සභාවට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වජිර අබේවර්ධන මැතිතුමා ගංවතුර සාකච්ඡාවක් සඳහා පැමිණුනා. එදා මම විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ලෙස ඒ සාකච්ඡාවට සම්බන්ධ වුණා. එම අවස්ථාවන්වල තේ පැන් සංග්‍රහ ලබා දුන්නා. නොයෙකුත් අවස්ථාවල සභාපතිවරුන්, තමන්ගේ කොට්ඨාස තව කෙනෙක් ආවොත්, තිබෙන අක්මුදල් වලින් හරි, තේ එකක් දෙනවා. උදාහරණ වශයෙන් ආසියානු සංවර්ධන බැංකුවෙන් කොහේ හරි ගොඩනැගිල්ලක් කරන්න ආවොත්, ඒ එන දහ පහළොස් දෙනාට හොටෙල් එකකට එක්කගෙන ගිහිල්ලා කෑම වේලක් දෙනවා. මේ සභාපතිවරුන් කරපු කාර්යයන් එක්ක බැලුවම, මේක සාමාන්‍ය සිද්ධියක්. මේ සිද්ධිය සම්බන්ධයෙන් අපි කණගාටු වෙනවා. මොකද මේ ආකාරයෙන් සභාවේ විවිධ කාලගෝට්ටි ඇතිවුණා.

ඒ වගේම මම කනගාටු වෙනවා. පාරවල් එකසිය ගානක් මොකටද කාපට් කරලා කියලා. පහුගිය කාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ආපු සංවර්ධන යෝජනා මේ සභාවේදී ඉදිරිපත් කළා කියලා, ඔබතුමන්ලාට මතක ඇතිනෙ. සමහර ඒවා කළා. සමහර ඒවා අතපසු වී මුදල් නැවත ගියා. මේ එකසිය ගාණක පාරවල්වලින් කිහිපයක් පමණයි කියෙව්වේ. ලක්ෂ 20 පාරවල් තව 50 ක් විතර පටන් ගන්න තියෙනවා. හෙට අනිද්ද කරන්න බැරි වෙයි. තවත් පාරවල් සීයක් දෙසීයක් විතර තියෙනවා. ඒ වගේම විශේෂයෙන් පහුගිය කාලේ අපට අමාරුකම් තිබුණත්, ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්ව වගේ දුගී දුප්පත් අයට සමෘද්ධි කාඩ් කීපයක් හැදුවා. ගම් වල දැන් ඒක සමෘද්ධි කාඩ් නතර කරල තිබුනෙ. ආණ්ඩුව කිව්වා නතර කරනවා කියලා. නමුත් අපි මැදිහත් වෙලා සමෘද්ධි කාඩ් පහක් හයක් අපේ ගම් වල හැදුවා. ඒ වගේම දුගී දුප්පත් අඩුආදායම්ලාභී අයට ලක්ෂ හයක් වියදම් කරලා නිවාස 50ක් විතර දැන් හදලා ඉවරයි.හැම ග්‍රාම නිලධාරී වසමකම නිවාස පහක් හයක් හදන්න අනුමැතිය දීලා තියෙනවා. අපේ උඩලමත්ත වසමට නිවාස යෝජනා වෙලා නැහැ. උඩලමත්ත උතුරට නිවාස පහක් අනුමත වෙලා තියෙනවා. දෙකක් අඩිතාලම දාලා තියෙනවා. අපේ ජනතාවට ලක්ෂ 05 ක් දුන්නා. ඌරල කොට්ඨාසයට ගෙවල් හයක් හදලා තියෙනවා. විශාල වැඩ කොටසක් කරනවා. ඒ වගේම අතිගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ පුනරාගමනයත් එක්ක තමයි මේ දේවල් ඇතිවෙලා තියෙන්නේ. එතුමා දක්ෂ නිලධාරියෙක්. එතුමගේ ලබන අයවැයට මුළු රටේම දුගී දුප්පත් බව නැති කරන්න, ඒ වගේම දුප්පත් ජනතාවට සහනය ලබා දෙන්න. එතුමාගෙන් සමෘද්ධි කාඩ්පත් විතරක් නෙවෙයි. නොයෙකුත් ආධාර ලබා දීලා, රසකැවිලි හදන අයට ආධාර දීලා, මුදල්මය ආධාර දීලා, ද්‍රව්‍යමය ආධාර දීලා, ලබන අවුරුද්දේ විශාල වැඩ පියවරක් ලබා දෙනවා. එය හඳුන්වා දීමත් එක්ක ලබන අයවැයක් එක්ක බලාපොරොත්තු වුන සංවර්ධන කාර්යය ලබන අයවැයෙන් කරන්න දේශපාලන නායකත්වය, අපේ ජනාධිපතිතුමාගේ නායකත්වය, අගමැතිතුමා ඇතුළු අපේ රජය විසින් ඒ සඳහා සියලු සැලසුම් සකස් කරමින්, දැනටමත් මෙතුමාගේ අතේ තියෙන්නෙ 2022 අයවැය යෝජනාවට ඇතුලත් කරන යෝජනා. ඒවා ක්‍රියාත්මක වුනොත්, යම් ගැටලුවක් පැනනගී ද යන්න තමයි ගැටලුව. අපි පත් කළ ආණ්ඩුව ශක්තිමත් ආණ්ඩුවක්. කොරෝනා වසංගතය වෙලා ගත්ත වෙලාවෙදි අපි ශ්‍රී ලංකාවේ ජනතාව සමඟ ඉන්න කටයුතු කරල තියෙනවා.මේ ප්‍රශ්නය අපේ රටට විතරක් නෙවෙයි. රටවල් අතර තියෙන පොදු ප්‍රශ්නයක්. මෙවන් තත්වයක් මත ජනතාවට සහන ලබාදීම සම්බන්ධයෙන් සතුටු වෙනවා. ඔබ දකින සුන්දර සිහින හෙලා නොදකිමින්, කතා කරනවා. මේ කාලේ අපි දකිනවා පොහොර ප්‍රශ්නය පිළිබඳව. ඒවට මුහුණ

දීලා ඉදිරියට යාමට අපේ ජනාධිපතිතුමාට හා අපේ රජයට ශක්තිය, ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. මම සභාවේ සභාපතිත්වය දරන කාලය තුල බලාපොරොත්තු වෙන්නේ නැහැ. බෙදීම් ඇති වෙන්න දෙන්න. බෙදීම් ඇතිකරගන්න. නමුත් ගියවර සභාවෙදි ඉදිරි ගෙවීම් වලදීත්, මෙදිනත් යම් යෝජනා 2කට ඡන්දයක් තියන්න සිදු වුණා. මම ඒ ඡන්දයකට යන්න කැමැති නැති වුණත්, නීත්‍යානුකූල අවශ්‍යතාවය නිසා එවැනි ඡන්දයකට ගියා. පළවෙනි එක j. c. b. යන්ත්‍රය පිළිබඳව. ඒ ගැන වැඩි යමක් කතා කරන්න අවශ්‍යතාවයක් නැහැ. විශේෂයෙන්ම සියලු දෙනාම ඒ බව දන්නවා. වර්තමානය අනුව වෙන්දේසි කිරීම හැර වෙන විකල්පයක් අපිට නොමැති බව ඔබ අප කවුරුත් දන්නවා.

පාසල් ආරම්භ කිරීම සඳහා පැවැත්වූ සාකච්ඡාව සඳහා රුපියල් හාරදහස් ගණනක බිලක් සම්බන්ධයෙන් දෙවන ඡන්දය ඇති වුනා. මේ රුපියල් හාරදාහක සංග්‍රහ වියදම් සම්බන්ධව, ප්‍රකාශ කළොත්, පසුගියදා පාසල් ආරම්භ කිරීම හා කොවිඩ් ප්‍රශ්නය සම්බන්ධ සාකච්ඡාවක්, ගරු ආණ්ඩුකාරතුමා ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව කැඳවලා, සභාපතිවරුන්, දකුණු පළාත් පළාත් පාලන ආයතන ප්‍රධානීන්, ප්‍රධාන ලේකම්, දිස්ත්‍රික් ලේකම්, අධ්‍යක්ෂක දකුණු පළාත් කොමසාරිස්, දකුණු පළාත් පළාත් පාලන අධ්‍යක්ෂක, දිස්ත්‍රික් තරුණ සේවා අධ්‍යක්ෂ, ගාල්ල, මාතර, හම්බන්තොට දකුණු පළාතේ සියලුම කලාප අධ්‍යක්ෂවරුන් කැඳවලා, රැස්වීමක් තිබුනා. ඒ රැස්වීමෙදි ගත්ත තීරණයක් තමයි පාසල් ආරම්භ කිරීමේදී, ශිෂ්‍ය සංඛ්‍යාව 200 ට අඩු පාසල් විවෘත කිරීම සම්බන්ධව. "ඒ ඒ පළාත් පාලන ආයතන වලට බෙදී යන ආකාරය පිළිබඳ සටහනක් ටයිප් කර කඩිනමින් අදාළ ආයතන වෙත, ප්‍රාදේශීය සභා හා දේශපාලන නායකත්වයට දැනුම්දීමට ආණ්ඩුකාරතුමා විසින් දැනුම් දෙන ලදී". මේ අනුව තමයි "ඔක්තෝම්බර් මස 2, 3, 4, 5, 6 යන දිනවලදී විදුහල්පතිවරුන් ගුරුවරුන් සමඟ සාකච්ඡා කර, එම සාකච්ඡා මගින් අදාළ ප්‍රදේශයේ දේශපාලන නායකත්වයක් සම්බන්ධ කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් උපදෙස් ලබාදී ඇත". ඒ අනුව මන්ත්‍රීවරු දැනුවත් කළා. සුභාෂි මන්ත්‍රීතුමියගේ දැණුම් දීම තුල බොහෝ මන්ත්‍රීවරු සහභාගි වුණා. ඒ අවස්ථාවේ ඔවුන්ට තේපැන් සංග්‍රහයක් කළා. එම බිල ගෙවද්දී, ඒක ගෙවන්නේ කොහොමද කියලා ලේකම්තුමියට ප්‍රශ්නයක් ආවා. මම කොමසාරිස්තුමාගෙන් මේ සම්බන්ධව විමසුවා. ආණ්ඩුකාරතුමා ප්‍රශ්නයක් නෑ කිව්වා. රුපියල් හාරදහස් ගණනක් ගෙවන්න කොමසාරිස්තුමාට කතා කරලා, නියෝජ්‍ය කොමසාරිස්තුමාට කතා කරලා, විමර්ශන නිලධාරීතුමියට කතා කළා. මට මේක ගෙවන්න තිබ්බා. නමුත් මම නීත්‍යානුකූලව මේ දේ කළේ. මෙතන මම දකින විදිහට වැරැද්දක් නැහැ. තව දෙයක් උප සභාපතිතුමා කිව්ව වගේ, අපි මන්ත්‍රීවරුන්ට හැමදේටම ආරාධනා කළා. කවුද ආවෙ? ආදාහනාගාරය විවෘත කරන උත්සවයට කිසි කෙනෙක් ආවෙ නැහැ. වනමල් මන්ත්‍රීතුමා විතරයි ආවෙ. පාසල් ආරම්භ කිරීම සම්බන්ධව රජයට විරුද්ධ අය කැමති නැහැ. තමන්ගෙ දරුවෝ අධ්‍යාපනය ලැබුවත්, රජය අපහසුතාවයට පත් කරන්නයි ඕන. ඒ නිසා තමයි ඒ උදවිය එන්නෙ නැත්තෙ. නමුත් ඉදිරියේදී ඔබතුමාලට කතා කරන්නම්. සම්බන්ධ කරන්නම්. පැමිණීම, නොපැමිණීම ඔබතුමාලගෙ වැඩක්. ඒ පිළිබඳව ආණ්ඩුකාරතුමා වරදක් කරල නැහැ. ආණ්ඩුකාරතුමා නීත්‍යානුකූලව ප්‍රදේශයේ ප්‍රධාන අධ්‍යාපන බලධාරියා හැටියට, එතුමන් නියෝග දුන්නා. අපි ඒ නියෝග ක්‍රියාත්මක කළා. ආපු අයට සංග්‍රහ කළා. වියදමක් දැරුවා. ඒ අනුව කිසිදු වංචාවක් වෙලා නැහැ. නමුත් ඡන්දයකට යාම සම්බන්ධයෙන් මට ලොකු කනගාටුවක් තියෙනවා.

ඒ වගේම යටලමත්තේ වොලිබෝල් පිටිය පිළිබඳව කතා වුණා. යටලමත්තෙ තරුණ පිරිසක්, රමේෂ් පතිරණ ගරු අමාත්‍යතුමා මුණගැහිලා, මේ සම්බන්ධව කතා කරල තියෙනවා. ස්ථානයක් ගැන ඇහුවම, ඔය ස්ථානය පෙන්නලා තියනවා. ඒක වත්තත් එක්ක කතා කරලා, සභාව හරහා තමයි ගන්ඩ ඕන. සභාවට ආවම, සභාව හරහා ලිපියක් ඉදිරිපත් කරනවා. පර්චස් 20 ප්‍රමාණයක් තමයි ලියලා දුන්නෙ. වතු සමාගමේ සභාපතිවරයා, මාගේ මිත්‍රයකු වන අතුල කරුණාරත්න මහත්තයාගේ ඥාති සහෝදරයෙක්. පරාක්‍රම දිසානායක මැතිතුමා. එතුමා සම්බන්ධ වෙලා කතා කරලා, ඊට වඩා වැඩිපුර ප්‍රමාණයක් ගන්න හිටියේ. නමුත් ඉක්මනින් වැඩේ කරගන්න ක්‍රීඩා සමාජයේ තරුණ පිරිසට අවශ්‍ය නිසා, මෙසේ ඉක්මන් වුණා. නීත්‍යානුකූලව සභාවෙන් කරන්න ඕන කියලා, මේ කටයුත්ත මම තාවකාලිකව නතර කළා. ඊට පස්සේ තමයි මේ වැඩ කටයුත්ත පටන් ගත්තේ. ඒක නිසා ඒකෙ වැරැද්දක් වෙන්න දෙන්නෙ නැහැ.උප සභාපතිතුමා කිව්වා පරිදි පර්චස් 20 ප්‍රමාණය මදි.

ඒවගේම වනමල් මන්ත්‍රීතුමා ප්‍රකාශ කල වගේ මාපලගම ළමා උද්‍යානය තවම හදාගෙන යනවා. හදලා ඉවර වුනාට පස්සේ අඩුපාඩු ප්‍රකාශ කරන්න. ඒ වගේ අපේ මන්ත්‍රිතුමන්ලා දරුවෝ හම්බ වුණ ගමන්ම ඇවිද්දවා ගන්න බලනවා. ඒ නිසා අපේ මන්ත්‍රීවරුන් ඒ ගැන මදක් හිතන්න. යම් වරදක් වෙනවා නම්, අපිට කියන්න. මේ සභාවේ මම කිසි විටෙකත් වරදක් කරන්නේ නැහැ. වරදක් වෙන්න ඉඩ තියන්නෙත් නැහැ. මම කාටවත් කොන්ද නමන්නේ නැහැ. මගේ කොන්ද නම්‍යශීලි නිසා, හැමදෙනාම එකතු කරගෙන යන්න ඕන නිසාත්, තනතුරේ වගකීම වැදගත් ලෙස ඉටු කරනවා. මම මගේ ඇඟේ හයිය පෙන්නලා වැඩ කරන්න යන්නේ නැහැ. මගේ වැඩපිළිවෙළ සුහදත්වය තුල තමයි. ඒ නිසා තමයි මම හුඟක් වැඩ කරගන්නෙ. මම ඔලුව පහත් කරලා නම්‍යශීලීව තමයි කටයුතු කරන්නේ. කවුරුත් හිතන්න එපා නාගොඩවිතානගේ කොන්ද නැහැ කියලා. ඕන දේකට මුහුණ දෙන්න පුළුවන් ශක්තියක් මට තියෙනවා. ඒක මාගේ දෙමව්පියන් මට දුන් දායාදයක්. එක මන්ත්‍රීවරයෙක් කිව්වා. බල්බ් එකක්වත් දීලා නැහැ කියලා. අන්න එතනදි නම් මට හිතන්න වන දේවල් බොහෝමයි. මගේ පෞද්ගලික දෙයක් නෙවෙයි මේක. එනිසා සාමූහිකව තමයි වැඩ කටයුතු කරන්න ඕන. ඉදිරියේදී ඒ අනුව ඒ අඩුපාඩුව විසඳේවි.

ඒ වගේම අපේ ගුරු ප්‍රශ්නය පිළිබඳව කතා කළා. ඒ වගේම ඒ සම්බන්ධව අපේ විදුහල්පතිතුමන් කතා කලා. ඒක ඇත්ත අවශ්‍යතාවයක්. ගුරුවරුන්ගෙ උද්ඝෝෂණවලට අපි වරදක් කියලා කියන්නේ නැහැ. නමුත් අවස්ථානුකූලව වරදක් හැටියට තමයි අපි දකින්නේ. මේ කාල වකවානුව තුළ වර්ජන උද්ඝෝෂණ කළ ඒක තමයි වරද. ඒ හා සමගාමීව මේ දැනුත් පාසල ඉදිරිපිට උද්ඝෝෂණයක් සිදු වෙනවා. රිචර්ඩ් පතිරණ මැතිතුමා තමයි ගුරුවරුන්ගේ වැටුප් විෂමාචාර වෙනස් කලේ. එතුමාම තමයි ගුරු පඩි වැඩිකරලා, ශ්‍රේණි හදලා දුන්නේ. මෙතන මිනිස්සු සාධාරණ වෙන්න පුළුවන්. නමුත් ගුරුවරුන් ට පඩි වැඩි කලහම, අනිත් අයත් ඉල්ලීම් කරනවා. ඒ නිසා රජය තීරණයක් අරන් තිබුණා. යථා කාලයේදී අදියර දෙකකින් ගුරු පඩි වැඩි කරනවා කියලා. ආණ්ඩුවත් නම්‍යශීලී වුණා. අපි කවුරුත් මේකට විරුද්ධ වන්නේ ඇයි? ඔබතුමාලා බීබීසී, වැනි නාලිකා බලනවනම් ලෝක තත්ත්වය හා බලන විට, අපේ රට වාසනාවන්. සරණාගතයෝ වෙඩි කකා රටවල් වලින් පනින්න යනවා. ඇෆ්ගනිස්ථානය කොයිතරම් දියුණු රටවල් ද? නමුත් මේ සියලු රටවල් අභිබවා ලංකාව ඊට හොඳ තත්ත්වයෙන් ඉන්නවා. මොකද මම අතීතය ගැන කතා කරන්න යන්නේ නැහැ. පහුගිය ආණ්ඩු ගැන කතා කරන්න යන්නෙ නැහැ. අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ, තීක්ෂණ බුද්ධියක් සමග තමයි මෙවර කටයුතු වෙන්නේ. යම් ප්‍රශ්න නිසා අපි පීඩාවට පත්වෙනවා. උදාහරණ වශයෙන්, පොහොර ප්‍රශ්නය. මේ සම්බන්ධව යම් යම් අඩුපාඩුවක් වෙන්න ඇති. නමුත් මතක තියාගන්න, ධර්මසිරි මන්ත්‍රීතුමාත් සාක්ෂි දරනවා. අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ අපි පෞද්ගලිකව හමුවෙලා සාකච්ඡා කළා. මේ පොහොර ප්‍රශ්නය කඩිනමින් විසඳන බව එතුමා ප්‍රකාශ කළා. ඒ අනුව පොහොර ප්‍රශ්නය පිළිබඳ ඉදිරියේදී සාර්ථක පිළිතුරක් ලැබේවි. තව අවුරුදු දහයක් පහලවකට පස්සේ කියාවි. මේ ආණ්ඩුව ගත්ත හොඳම තීරණය කියලා.

බලන්න, මැතිනිගේ ආණ්ඩුව කාලේ යම් යම් ක්‍රියාමාර්ග නිසා, එම ආණ්ඩුව පෙරලලා, වෙනත් ආණ්ඩුවක් පත් කළා. නමුත් පසුව කිව්වා ඊට වඩා හොඳයි මැතිනිගේ ආණ්ඩුව තිබුණනම් කියලා. ඕක තමයි ඇත්ත. ගත්ත තීරණය ක්ෂණික වීම නිසා තමයි මෙතරම් ගැටලු මතු වුණේ.

කොහොම නමුත් කොවිඩ් වලින් අපි සියලු දෙනාම බැට කැවා. මේ වන විට යම්තාක් දුරකට සමනය වෙලා තියෙන්නෙ. අපි තවදුරටත් හිතන්න ඕන. අපි සෞඛ්‍ය උපදෙස් පිළිපදින්න අවශ්‍යයි. අද වුණත් මේ සභාව ඉදිරිපිට තියෙන උද්ඝෝෂණය භයානකයි. එක කොරෝනා රෝගියෙක් හිටියොත්, මුළු පළාතටම යනවා. ඒක හිතන්න ඕන. ඒක තමයි අපි විරුද්ධ. මම මීට වඩා යමක් කියන්නේ නැහැ. නාගොඩ ප්‍රාදේශීය සභාව වශයෙන් මන්ත්‍රීවරු සියලු දෙනා ඇවිල්ලා, යම් යම් මත වාද ප්‍රකාශ කළා. වෙන ප්‍රාදේශීය සභාවල මත ගැටුම්, ඩෙස්ක් උඩ නැගලා, රණ්ඩු සරුවල් වෙනවා. කොහොම වුණත් අපේ සභාව සුහදත්වයෙන් පිරි සභාවක් හැටියට තමයි පිළිගන්න වෙන්නේ. ඒ ් පිළිබඳව සතුටු ප්‍රකාශ කරමින්, අපෙන් අඩුපාඩුවක් වෙනවා නම්, එය පෞද්ගලිකව පෙන්වා දෙන්න.

අද සභාවේ කටයුතු නිසි පරිදි සටහන් කර ගන්න. ඒ වගේම සභාවේ කතා වූ යම් යම් දැනුම් දීම්, දැනුම් දිය යුතු දේවල්, අවශ්‍ය ආයතනවලට දැණුම් දීමට කටයුතු කරන ලෙස ඔබතුමියන්ලාගෙන් ඉල්ලා සිටිමි. සමහර මන්ත්‍රීවරුන් අදහස් ප්‍රකාශ කිරීමේ දී, යම් යම් සිත් රිදීම් සිදුවුනා නම් ඒ ් සම්බන්ධව කනගාටුව ප්‍රකාශ කරමින්, වනිගරත්න මන්ත්‍රීතුමාගේ කතාවේදී ලක්රුවන් මන්ත්‍රීතුමාගේ නම සඳහන් කළා. ඔබතුමාගේ කැමැත්ත පරිදි නම ඉවත් කර දෙන ලෙස ඉල්ලා සිටිමින්, රංජිත් ජයවීර මැතිතුමා සභාවට පැමිණීමට නොහැකි බව දැන්වූවා. ඒ නිවාඩු අනුමත කරමින්, අද සභාවට පැමිණි සියලු දෙනාටම බෙහෙවින් ස්තුතිවන්ත වෙමින්, සැමදෙනාටම සම්මා සම්බුදු සරණ පතමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**සභා වාර්තාව ස්ථිර කිරීම පිළිබඳ ගරු සභාපතිතුමාගේ ප්‍රකාශය**

2021.11.09 දින පවත්වන ලද සභා වාරයේ රැස්වීම් වාර්තාවේ විරෝධතා නිවැරදිකිරීම් වලට යටත්ව සම්මත කරන ලද බව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                    දිනය:-